*සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 175-197*
*ISSN 1800-1459*

# ස්ත්‍රීවාදය: තත්කාලීන ශ්‍රී ලාංකේය ස්ත්‍රීවාදීන් මුහුණ දෙන අභියෝග

**චන්දිමා ජයසේන**

සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, බෙලිහුල්ඔය.

## සාරසංක්ෂේපය

මෙම පර්යේෂණ ලිපියෙහි මුඛ්‍යාර්ථය වන්නේ ලාංකේය සමාජය තුළ ස්ත්‍රී විමුක්තිය පිළිබද කතිකාව හා තත්කාලීන ස්ත්‍රීවාදීන් මුහුණ දෙන අභියෝග පිළිබඳ සාකච්ජා කිරීමයි. මෙහිදී මූලික වශයෙන් ස්ත්‍රීවාදය පිළිබද විශ්ලේෂණය කිරීමේ දී ස්ත්‍රීවාදය මෙන් ම ස්ත්‍රීවාදී කේන්ද්‍රීය න්‍යායික හා දෘෂ්ටිමය ප්‍රශ්න හා එය ශ්‍රී ලංකාවේ ස්ත්‍රීවාදය සම්බන්ධයෙන් පවතින අදාළත්වය මෙම ලිපිය මගින් සාකච්ජා කෙරේ. ශ්‍රී ලංකාව වැනි රටවල ස්ත්‍රී විමුක්තිය මෙන් ම ස්ත්‍රීවාදය ද ව්‍යාප්තව තිබෙන්නේ විවාදාපන්න ප්‍රස්තුතයක් ලෙසයි. ස්ත්‍රීවාදය අපරදිග චින්තනයක් ලෙස බැහැර කිරීම, සමාජ සංස්කෘතිය, තුන්වන ලෝකයේ බොහෝ රටවල් යටත් විජිත බවට පත්වීම හරහා අනෙකුත් චින්තන ධාරාවන් මෙන් ම ස්ත්‍රීවාදය ද ක්‍රමික ව විකාශනය නොවීම, පවතින සමාජ ආකල්ප යනාදී කරුණු තත්කාලීන ශ්‍රී ලාංකේය ස්ත්‍රීවාදීන් මුහුණ දෙන අභියෝග අතර හඳුනාගත හැකි සාධක වේ. ස්ත්‍රීවාදය සහ න්‍යායාත්මක ප්‍රවේශයන් යොදා ගනිමින් ප්‍රධාන පර්යේෂණ අරමුණ සාධනය කිරීමට උත්සාහ කෙරේ.

**කේන්ද්‍රීය වචන:** ස්ත්‍රීවාදය, ස්ත්‍රී විමුක්තිය. අපරදිග චින්තනය, තුන්වන ලෝකය, යටත්විජිත, සමාජ ආකල්ප

## හැඳින්වීම

ශ්‍රී ලාංකේය සමාජය තුළ ස්ත්‍රී විමුක්තිය පිළිබද කතිකාව ව්‍යාප්ත වී තිබෙන්නේ විවාදාපන්න ප්‍රස්තුතයක් ලෙස යි. එබැවින් ශ්‍රී ලාංකේය ස්ත්‍රීවාදය ව්‍යාප්තය පිළිබඳ ව ඇති ගැටලු සහ පවතින අභියෝග හඳුනාගැනීම වැදගත් වේ. විශේෂයෙන් ස්ත්‍රීන්ගේ අයිතිවාසිකම්, ස්ත්‍රීන්ගේ දේශපාලන සහභාගීත්වය, ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සහ සමාජ සංස්ථාවන්හි පවතින පුරුෂාධිපත්‍යය ඈගයුම් මඟින් ස්ත්‍රියට සිදුවන අසාධනතාව නිසා ඇය ප්‍රධාන සමාජ ප්‍රවාහයට අවශෝෂණය කර ගැනීමේ ගැටලු තවදුරටත් හඳුනාගත හැකි ය. මෙවන් සංදර්භයක ස්ත්‍රිය සහ සංවර්ධනය පසුගාමී සාධකයක් ලෙස හඳුනාගත හැකි අතර එය ශ්‍රී ලාංකේය සමාජ ආර්ථික වර්ධනයටත් ස්ත්‍රීන්ගේ හා පුරුෂයින්ගේ පුද්ගල අනන්‍යතාව ගොඩ නැගීම කෙරෙහි ඍණාත්මක බලපෑමක් ඇති කරන බව පෙනේ.

ස්ත්‍රීන්ගේ ගැටලු ප්‍රධාන වේදිකාවට ගෙන ඒමට ද ස්ත්‍රී ව්‍යාපාරය තරමක් සාර්ථක වී ඇත. පුරුෂාධිපත්‍යයෙහි අසාධාරණත්වය ගැන සිතීමටත් ආත්ම ශක්තිය වැඩි දියුණු කර ගැනීමටත් පිතෘ මූලිකවාදයේ මුහුණුවරට අභියෝග කිරීම සඳහා සංවිධානය වීමටත් බොහෝ ස්ත්‍රී කණ්ඩායම් හා රාජ්‍ය නොවන සංවිධාන කම්කරු පාන්තික සහ මධ්‍යම පාන්තික ස්ත්‍රීන්ට උදවු කර ඇත. ස්ත්‍රී පුරුෂ සමාජයන්හි සම්බන්ධතාවන් වඩා සමාන සහ යුක්ති සහගත වීමට නම්

ගැහැණුන් මෙන් ම පිරිමින් ද වෙනස්විය යුතු ය. ශ්‍රී ලාංකේය ස්ත්‍රීවාදය ව්‍යාප්තිය සම්බන්ධයෙන් පවතින ගැටලු අතර අපරදිග චින්තනයක් ලෙස බැහැර කිරීම, සමාජ සංස්කෘතිය, තුන්වන ලෝකයේ බොහෝ රටවල් යටත් විජිත බවට පත්වීම හරහා අනෙකුත් චින්තන ධාරාවන් මෙන් ම ස්ත්‍රීවාදය ද ක්‍රමික ව විකාශනය නොවීම, පවතින සමාජ ආකල්ප යනාදී කරුණු හඳුනාගත හැකි ය.

## සාහිත්‍ය විමර්ශනය

සමාජවිද්‍යා ශාස්ත්‍රීය ශික්ෂණයෙහි විවාදයට හා විවේචනයට භාජනය වූ මූලික ගුරුකුලවල ස්ත්‍රීපුරුෂ සමාජභාවය ස්වාභාවික ව හා මධ්‍යස්ථ ලෙස ද භාජනයට ලක්විය (Tong, 1989; Smith, 1979,1987; Eichler ,1980; Stanley and Wise , 1983; Roberts, 1981 ). ස්ත්‍රීවාදීන් දැනුම නිෂ්පාදනය කිරීමේ දී ප්‍රධාන මූලිකාංගය ලෙස සාකච්ඡා කළේ ස්ත්‍රීපුරුෂ සමාජභාවයයි (Dominelli, 1997:26). ස්ත්‍රීපුරුෂ සමාජභාවීය වෙනස්කම් සමාජ සංස්ථාවන්හි හඳුනා ගැනීමෙන් තොර ස්ත්‍රීවාදයක් සාකච්ඡා කිරීම නිෂ්ඵල බව ඩොමිනෙල්ලි (2007:28) දක්වයි. ස්ත්‍රීපුරුෂ සමාජභාවය ලෙස හඳුනාගත හැක්කේ සමාජ සංස්කෘතික නිර්මිතය ලෙස දක්වයි. ස්ත්‍රීපුරුෂ සමාජභාවය ස්ත්‍රීවාදය ඉදිරියට ගෙන යාම සඳහා සැලකිය යුතු දායකත්වයක් සපයා ඇත.

ස්ත්‍රීවාදය නූතන සමාජ දේශපාලන ව්‍යාපාරය තුළ නවක සංකල්පයක් ලෙස හඳුනාගත හැකි ය. විශේෂයෙන් ම ශ්‍රී ලංකාව වැනි රටවල එක ම ආකාරයෙන් පිළිනොගන්නා වත්මන් දේශපාලන කතිකාව තුළ විවාදාත්මක ස්වරූපයෙන් නිරන්තරයෙන් සාකච්ඡාවට බඳුන් වන ප්‍රවේශයක් ලෙස ස්ත්‍රීවාදය හඳුනාගත හැකි ය. ඒ මන්ද යත් ශ්‍රී ලංකාව වැනි පෙරදිග රටවල ස්ත්‍රීවාදය ස්ථාපිත වී තිබෙන්නේ ම ගැටලුකාරී ප්‍රස්තුතයක් ලෙසයි. එයට බලපාන ප්‍රධාන හේතුව නම් සමාජ සංස්කෘතිය ප්‍රතිනිර්මාණය කරන මතවාදයන් තවදුරටත් සමාජයෙහි ස්ථාපිත වී තිබීමයි. මෙහිදී සාම්ප්‍රදායික සමාජ, දේශපාලන න්‍යායයක් ම පුරුෂ කේන්ද්‍රීය ව ඉදිරිපත් කරමින් එයට අභියෝග කිරීම මගින් ස්ත්‍රීවාදයට ප්‍රතිවිරෝධතා එල්ල වූ බව පිළිගත හැකි ය. පුරුෂයින් සෑම විට ම වරප්‍රසාද සහිත කණ්ඩායමක් ලෙස පිළිගැනීමත් ස්ත්‍රීය ගෘහස්ථයට සීමා කිරීම වැනි පවතින සමාජ පර්යායට එල්ල කළ අභියෝගය ස්ත්‍රීවාදීන් ළංකරගත් ජයග්‍රහණයකි.

> "බොහෝ සමාජ දේශපාලන න්‍යායයන්, ස්ත්‍රිය අර්ථ කථනය කළේ පුරුෂයාට උදව් හා සේවා සපයන, සතුට සලසන, දරුවන් රැකබලා ගන්නා තැනැත්තියක ලෙසය" (ලියනගේ, 2007:83).

ප්ලේටෝ ඇරිස්ටෝටල් වැනි චින්තකයින් ද ස්ත්‍රීන් කෙරෙහි දැක්වූයේ තාර්කික නොවන මානසික ශක්තියෙන් හීන අය ලෙසයි. සිග්මන්ඩ් ෆොයිඩ් මනෝවිශ්ලේෂණවාදයෙහි දීත් දැක්වූයේ මෙයට සමාන අදහසකි. ස්ත්‍රීවාදී සාහිත්‍යය ආරම්භ වීමට මත්තෙන් මෙවන් මතවාද ලෝකයේ ස්ථාපිත වී තිබුණත්, 19වැනි සියවසේ නිදහස්කාමී චින්තනයත් සමග ආරම්භ වූ මෙම චින්තන ධාරාව මෙන් ම සමාජ දේශපාලන ව්‍යාපාරය ස්ත්‍රිය පිළිබඳ මානුෂීය චින්තනයක් ගොඩනැගීමට දායක විය. මාරි වොලස්ටන්ක්‍රාෆ්ට් (Mary Wollestonecraft) ප්‍රංශ සමාජය තුළ ස්ත්‍රියගේ අවාසිසහගත තත්ත්වය පිළිබඳ ප්‍රශ්න කරමින්, 1972 දී ලියන ලද

A Vindication of the Rights of Women කෘතිය මගින් දක්වා ඇත්තේ ද ස්ත්‍රියගේ පීඩාකාරී බවට උදාහරණයකි.

> "ස්ත්‍රීභාවය පිළිබඳ අදහස සමාජ ඓතිහාසික ක්‍රියාවලිය ප්‍රතිඵලයක් ගැන අදහස දේශපාලනික වශයෙන් ඉතා වැදගත් එකක් විය. එහි අර්ථය වූයේ ස්ත්‍රී භාවය සමාජ ඓතිහාසික ක්‍රියාවලියක ප්‍රතිඵලයක් නම් එබඳු ම සමාජ ඓතිහාසික ක්‍රියාවලියකින් එය වෙනස් කිරීමට ද හැකි බවයි" (Cuff, 1990:375).

සමාජයේ වැදගත් සංස්ථාවන්ගෙන් ස්ත්‍රිය ඈත් කර තැබීමට සාධාරණ වූ හේතුවක් නොමැති අතර එය වෙනස් කිරීමට හැකියාවක් ද ඇත. තවද ස්ත්‍රිය ප්‍රධානත්වය ගන්නා වූ අනෙකුත් සංස්ථාවන්ගෙන් වැදගත්කම ගැන යළි සලකා බැලීම මගින් එම සංස්ථා හරහා ස්ත්‍රිය සමාජයට දරණ වැදගත් දායකත්වය හඳුනාගත හැක. සමාජ සංස්ථා පිළිබඳ යලි අර්ථකථනයක් ලබා දී ඒ මගින් ස්ත්‍රියගේ සමාජයට ඇති දායකත්වය පිළිබඳ වඩා දැනුවත් වීම අත්‍යවශ්‍ය බවට ස්ත්‍රීවාදීහු තර්ක කළෝ ය. මෙහිදී මූලික කාරණය ලෙස සැලකුවේ පවුල හා ගෘහස්ථ වැඩවලදී ස්ත්‍රියගේ දායකත්වය පිළිබඳ සාකච්ඡා කිරීමයි. මෙවැනි කාරණා ලෝකයේ පමණක් නොව ශ්‍රී ලංකාව වැනි පෙරදිග රටවල ද පොදු තත්ත්වයක් විය.

ඓතිහාසික වශයෙන් ස්ත්‍රීවාදය සම්බන්ධ පෙරදිග රටවල ද නිශ්චිත මූලයන් ගම්‍යමාන වුවත් එය ක්‍රමික ව ස්ථාපිත නොවන්නේ පුරුෂාධිපත්‍ය ඇගයුම්වලට දෙන වටිනාකම මතයි. ස්ත්‍රීවාදය යන්න අපරදිග චින්තනයක් ද යන්න ශ්‍රී ලංකාවේ ස්ත්‍රීවාදී ව්‍යාපාරය ආරම්භයේ සිට ම ගොඩනැගුණක් නිසා පෙරදිග සංස්කෘතික සීමාමායිම් වලට අභියෝග කිරීම පහසු කාර්යක් නොවේ.

> "ඇත්ත වශයෙන්, ස්ත්‍රීවාදය අපරදිග අපේරණයක් (නොමග යෑමක්) ය, පිරිහුණු අපරදිග රටවල දෘෂ්ටියක් ය යන්න ඉවත ලෑමට මග පෑදූ හේතුව වූයේ; අද ස්ත්‍රීවාදය වටා වන න්‍යායයන් පිළිබඳ මූළ මහත් ප්‍රශ්නය සංවර්ධනය වීමයි. නානාප්‍රකාර න්‍යායයන් සහ විග්‍රහයන් සහිත විවිධ චින්තන කාණ්ඩ කරණ කොට ගෙන, ස්ත්‍රීවාදය පිළිබඳ අදහස ගැන අදූරදර්ශී දෘෂ්ටියක් කරා, පෙරදිග රටවල අර්ධ වශයෙන් හෝ මුළුමනින් එය ඉවතලනු ලැබීම කරා, පෙරදිග රටවල අර්ධ වශයෙන් හෝ මුළුමනින් එය ඉවතලනු ලැබීම කරා, මග පෑදී ඇත. එය පෙරදිග සංස්කෘතියට නැතහොත් ආසියානු ජීවිත ක්‍රමයට නො ගැළපෙන්නක් ලෙස දකිනු ලබමින් ඇත" (තිරුචන්ද්‍රන්, 1995:1).

"ස්ත්‍රීවාදයට විශ්වීය පදනමක් ඇත" යන්න ප්‍රකට කිරීමට ගනු ලබන උත්සාහය සාධාරණ එකකි. එයට හේතුව වනුයේ ශ්‍රී ලංකාව වැනි රටවල කාන්තාවන්ට ඇති ගැටලු ආමන්ත්‍රණය කිරීමට විවෘත වේදිකාවක් රාජ්‍ය මට්ටමෙන් හෝ වෙනත් ආකාරයෙන් ප්‍රබල මැදිහත් වීමක් ඉස්මතු නො වීමයි. මෙවන් තත්ත්වයක් තුළ තවදුරටත් පීඩාවට පත්වන්නේ කාන්තාවන් ය. සංවර්ධිත රටවලට සාපේක්ෂ ව සංවර්ධනය වෙමින් පවතින රටවල ස්ත්‍රීයට ඇති තත්ත්වය පිළිබඳ ශ්‍රී ලංකාවේ කාන්තාවන් පිළිබඳව ඇති සාහිත්‍යයෙන් හඳුනාගත හැක.

## පර්යේෂණ ගැටලුව

තත්කාලීන ශ්‍රී ලාංකේය ස්ත්‍රීවාදීන් මුහුණ දෙන අභියෝග මොනවා ද? යන්න ප්‍රධාන පර්යේෂණ ගැටලුව ලෙස දැක්විය හැකි ය.

ඉහත ගොඩනගා ගත් පර්යේෂණ ගැටලුවට අනුව පර්යේෂණයේ ප්‍රධාන අරමුණු මෙසේ දැක්විය හැකි ය.

## පර්යේෂණ අරමුණ

ශ්‍රී ලංකාවේ ස්ත්‍රීවාදී ව්‍යාපාරයේ වර්තමාන තත්ත්වය හඳුනා ගැනීම.

### අනු අරමුණ

ශ්‍රී ලංකාවේ ස්ත්‍රීවාදී ව්‍යාපාරයේ ගැටලු සහ අභියෝග හඳුනා ගැනීම.

## පර්යේෂණයේ වැදගත්කම

ශ්‍රී ලංකාව වැනි රටවල ස්ත්‍රීවාදය හා ස්ත්‍රීන්ගේ ගැටලු පිළිබඳ ව පිළිනොගන්නා වත්මන් දේශපාලනික කතිකාව තුළ මෙම පර්යේෂණ ලිපියෙන් සාකච්ඡා කරනු ලබන ශ්‍රී ලංකාවේ ස්ත්‍රීවාදීන්ට ඇති අභියෝග සහ වර්තමාන තත්ත්වය පිළිබඳ ව ශාස්ත්‍රීය කථිකාවක් ඉදිරිපත් කිරීම වැදගත් වේ. විශේෂයෙන් ම බටහිර සහ පෙරදිග පරිශීලිත සාහිත්‍යය ඇසුරින් ගොඩනගාගත් න්‍යායාත්මක ප්‍රවේශය මඟින් හඳුනාගත හැක්කේ ස්ත්‍රීවාදය අපරදිග චින්තනයක් ලෙස බැහැර කිරීම පදනම් විරහිත බවයි. ස්ත්‍රීන්ගේ ගැටලුවල සහ අභියෝගයන්හි පවතින පොදු බව මෙම ශාස්ත්‍රීය ලිපියෙන් හඳුනාගත හැකි ය.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේ ප්‍රධාන පර්යේෂණ අරමුණ සාධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ස්ත්‍රීවාදී සාහිත්‍යය පරිශීලනය කරමින් ද්විතීයික මූලාශ්‍රය භාවිතයට ගනිමින් අධ්‍යයනය සිදු කරන්නට යෙදිණි. ඊට අමතර ව ප්‍රධාන පර්යේෂණ අරමුණ සාධනය කර ගැනීමෙහි ලා ස්ත්‍රීවාදය සම්බන්ධ න්‍යායාත්මක ධාරාවන්ගෙන් ආලෝකය ලබාගැනේ.

වර්තමානය වන විට තිරසාර සංවර්ධනය හා සංවර්ධනය පිළිබඳ විවිධ මතවාද හරහා සංවර්ධන ක්‍රියාවලියට කාන්තාවන් සම්බන්ධ කර ගැනීමට ලෝකය පුරා උත්සාහ ගෙන ඇත. විශේෂයෙන් තිරසාර සංවර්ධනය පිළිබඳ ව ලෝකය පුරා ගොඩනැගුණු කතිකාව මගින් ස්ත්‍රීපුරුෂභාවීය සහ සංවර්ධනයට වැඩි වැදගත්කමක් ලබා දී ඇත. ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටවල ණය සහ මූල්‍යාධාර ලබාදීමේ දී ස්ත්‍රියගේ තත්ත්වය පිළිබඳ අවධානය යොමුකරමින් ස්ත්‍රියගේ තත්ත්වය වැඩි දියුණු කිරීමට උත්සාහ කෙරේ. ශ්‍රී ලංකාව වැනි රටවල ස්ත්‍රීවාදීන් මුහුණදෙන අභියෝග සාකච්ඡා කිරීමට හා තේරුම් ගැනීමට මත්තෙන් ස්ත්‍රීවාදය පිළිබඳවත් ස්ත්‍රීවාදය බටහිර චින්තනයක් ද යන්නත් තේරුම් ගැනීම අත්‍යවශ්‍ය වේ.

## ස්ත්‍රීවාදය නිර්වචනය කිරීම

ස්ත්‍රීවාදය පිළිබඳ පහත සඳහන් නිර්වචනය සලකා බැලීම වැදගත් වේ.

> "ස්ත්‍රීවාදය (Feminism) 19 වෙනි සියවස අග දී ආරම්භ විය. ස්ත්‍රීවාදයේ මුලාරම්භය සම්භාව්‍ය ලිබරල් වාදයේ පුද්ගලවාදය, නිදහස, ස්වයං නිර්ණය අයිතිවාසිකම් හා සමානාත්මතාව වැනි මූලධර්ම මත පදනම් විය" (ලියනගේ, 2006:44).

මෙම සිද්ධාන්ත හා පුද්ගල අයිතීන් ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවය සම්බන්ධයෙන් ම අහිමි කළ නොහැකි අයිතීන් ලෙස ස්ත්‍රී විමුක්තිය දක්වා ව්‍යාප්ත කිරීමක් සිදුවිය. ස්ත්‍රීවාදයේ ආරම්භක සන්දිස්ථානය ලිබරල් ඇගයුම් මත සිදුවුවා යැයි හඳුනාගත හැක. ස්ත්‍රීවාදය, ස්ත්‍රී විමුක්තිය සඳහා නිර්මාණය වූ දේශපාලන ව්‍යාපාරයක් මෙන් ම න්‍යායාත්මක ධාරාවක් වේ.

> "ස්ත්‍රීන්ගේ නිදහස පිළිබඳ වූ මෙහි අරමුණ වූයේ සමාජයේ පුරුෂ මූලික ස්වභාවය පිළිබඳ, ස්ත්‍රීන්ව යටපත් කර ඇති ආකාරය පිළිබඳ කාන්තාවන් දැනුවත් කිරීමයි. මෙහිදී ප්‍රධාන තර්කය වූයේ ස්ත්‍රීන්ට තමන් යටපත් කරන ලද කණ්ඩායමක් බවත්, තම සෑම දෙනාම පොදු අරමුණු හා එකම ඉරණමක් ඇති අය බවත් අවබෝධ කර දීමයි" (Cuff, 1990:374).

ලිබරල් මතවාදයෙහි ස්ත්‍රීන්ට සමාජ සංස්ථාවන්හි (පවුල ආගම දේශපාලනය ආර්ථිකය හා අධ්‍යාපනය) තමන් යටපත් කරන ලද කණ්ඩායමක් බවත් යටපත් වී තිබෙන ආකාරය පිළිබඳ ව හඬක් නැගීමයි. ස්ත්‍රීවාදය මඟින් සාකච්ඡා කෙරෙන්නේ ස්ත්‍රියට හිමි අප්‍රධාන තත්ත්වයන් මුදවා සමාජය තුළ පුරුෂයාට මෙන් ම ස්ත්‍රියට ද අයිතිවාසිකම්, සමාජ ගරුත්වය ලබාදීම සහ ස්ත්‍රී ශරීරයක් හිමිවීම යන කරුණු අදාළ කරගෙන වෙනස්කම් වලට ලක්වීම ප්‍රතික්ෂේප කිරීමයි. ස්ත්‍රීන්ගේ ප්‍රශ්නවලට සමාජය විසින් පිළිතුරු දීමයි. ස්ත්‍රීවාදීන් ගෙන එන මතවාදය කේන්ද්‍රගත වන්නේ පුරුෂාධිපත්‍යයට එරෙහිවයි.

> "ස්ත්‍රීවාදීන්ට අනුව පීතෘ මූලිකත්වය යන්නෙන් විස්තර කෙරෙන්නේ ස්ත්‍රීන් මත පැටවෙන පුරුෂයින්ගේ ආධිපත්‍යය, පුරුෂයින් විසින් ස්ත්‍රීන් පාලනය කරනු ලබන ආකාරය හා ස්ත්‍රීන්ට සමාජය සලකන ආකාරය මෙන්ම කාලාන්තරයක් තිස්සේ එය වර්ධනය වූ ආකාරයත්ය"(ලියනගේ, 2006:30).

> "ස්ත්‍රීවාදය ආරම්භ වන්නේම පුරුෂ මූලික සමාජයට, සංස්ථා වලට එරෙහිවයි. ස්ත්‍රීවාදීන්ගේ ප්‍රධාන පාඨයක් වූයේ, 'පෞද්ගලිකභාවය දේශපාලනික වේ" (Cuff ,1990:374).

එමඟින් දක්වන්නේ පෞද්ගලිකභාවය යනුවෙන් අදහස් කරන්නේ ස්ත්‍රීත්වය නිසා සිදුවන පීඩාවයි. ස්ත්‍රියගේ ජීවිතයේ සියලු දේවල් පුරුෂමූලික සමාජ පර්යායකින් තීරණය කරන බව තේරුම් ගැනීමම ස්ත්‍රීවාදයට න්‍යායාත්මක ධාරවක් හා දේශපාලන ව්‍යාපාරයක් වීමට අවශ්‍ය අඩිතාලම සපයන ලදී.

නූතන අර්ථයෙන් ගත්විට ස්ත්‍රීවාදය න්‍යායාත්මක අදහස් මාලාවක්, විග්‍රහාත්මක දෘෂ්ටිවාදයක්, විචාරාත්මක හා විවාදාත්මක අදහස් හෝ මතවාද සමූහයක්

මෙන් ම සමාජ හා දේශපාලන ව්‍යාපාරයක් වශයෙන් ද හැඳින්විය හැකි ය. ස්ත්‍රීවාදය සමාජ හා දේශපාලන ව්‍යාපාරයක් වශයෙන් ද හැඳින්විය හැකි ය. ස්ත්‍රීවාදය සමාජ න්‍යායයක් ලෙස මූලික් වශයෙන් ස්ත්‍රීන්ගේ අත්දැකීම් මත පදනම් වී ඇත. සමාජයේ ස්ත්‍රී-පුරුෂ අසමානත්වය හා එහි ස්වභාවය, පීතෘමූලිකත්වය, ස්ත්‍රී-පුරුෂ බල සබඳතාව හා ලිංගිකත්වය පිළිබඳ නිවැරදි හා විස්තරාත්මක අර්ථකථනයක් සැපයීම ස්ත්‍රීවාදී න්‍යායන්හි මූලික අරමුණයි. ස්ත්‍රීවාදී න්‍යායයෙන් පවුල තුළත්, ලිංගික වශයෙනුත්, සමාජ, දේශපාලන හා ආර්ථික ක්ෂේත්‍ර තුළත් පුරුෂයාට සාපේක්ෂ ව ස්ත්‍රියට හිමි අසමාන තත්ත්වය පිළිබඳ විචාරාත්මකව පරීක්ෂා කෙරේ. දෘෂ්ටිවාදයක් ලෙස, ස්ත්‍රීවාදයෙන් පවුල හා සමාජය තුළ ස්ත්‍රීන්ට හිමි අප්‍රධාන තත්ත්වය හා ඔවුන්ගේ ක්‍රියාකලාපයන්ට නිසි අගයක් නොදීම හෝ අවතක්සේරු කිරීම පිළිබඳ ව අවධාරණය කෙරෙන අතර, එම තත්ත්වය තුරන් කිරීමට ප්‍රායෝගික වශයෙන් ක්‍රියා කිරීම එහි අරමුණ වේ (Encyclopedia of Women in American Politics, 1999).

Cuff (1990:374) අනුව ස්ත්‍රීවාදය යනු කුමක් ද? යන ප්‍රශ්නයේදී බොහෝ ස්ත්‍රීවාදිනියන්ට මෙන් ම ස්ත්‍රීවාදිනියන් නොවන අයට ද තේරුම් ගත යුත්තේ ස්වයං අත්දැකීම් පදනම් කරගෙන බිහිවූ ව්‍යාපාරයක් යන්න යි. "ස්ත්‍රියට හිමි තැන", පිළිබඳ පොදු මතය පිළිගැනීම යනු කාන්තාව කණ්ඩායමක් ලෙස යටපත් කිරීමකි. සමාජයේ තමන්ට හිමිව ඇති ස්ථානය "ස්වභාවිකව ම" තම ජෛව විද්‍යාත්මක ගති ලක්ෂණ නිසා තමන්ට හිමි වූ තැනක් යන්නට ස්ත්‍රිය තව දුරටත් විශ්වාස කළ යුතු නැත. තව ද, සමාජ ජීවිතයේ සෑම අදියරයකදී ම විවිධ ආකාරයට තමාව පුරුෂයාට වඩා පහත්කොට සලකන ආකාරය ස්ත්‍රිය අවබෝධ කරගත යුතු ය. මීට විරුද්ධ ව යාම පටන් ගත යුත්තේ තමන් මගින්ම ය. මක්නිසා ද? යත්, ස්ත්‍රිය තමාව වෙනස් කරගත හොත් සමාජයේ පුරුෂ මූලික භාවය ද බිඳ වැටෙනු ඇත.

මාග්‍රට් මීඩ්ගේ (Margaret Mead) Sex and Temperament in Three primitive Societies (1935) යන කෘතිය ස්ත්‍රීවාදයට නව ඇරඹුමක් ආරම්භ කරදුන් කෘතියකි. මෙහිදී ඇය සාකච්ඡාවට භාජනය කරන විශේෂිත කරුණ වන්නේ ප්‍රාථමික සමාජ පිළිබඳ අධ්‍යයනය කොට චම්බුලි ගෝත්‍රය (Tchambuli Tribe) තුළ කිසිදු ගැටුමකින් තොර ව පැවති ස්ත්‍රීන්ගේ ආධිපත්‍යය පිළිබඳ ව කරුණු හෙළි කිරීමෙන් ස්ත්‍රී-පුරුෂ සමාජ තත්ත්වය ස්වභාවයෙන් නිර්මාණය වූවක් නොව, සමාජ හා සංස්කෘතික සාධක විසින් නිර්මාණය කරන ලද්දක් ය යන විශ්වාසය වඩාත් තහවුරු කිරීම ද ස්ත්‍රීවාදී ව්‍යාපාරයට නව පන්නරයක් ලබාකර දුන්නේ ය.

## සාකච්ඡාව

### විවිධ මතවාද සමග ගොඩනැගුණ ස්ත්‍රීවාදය

බැන්ක්ස් (1981:24) දක්වන ආකාරයට විවිධ ගුරුකුලවල මතවාද සමග පෝෂණය වූ ස්ත්‍රීවාදය කාන්තාව සමාජ සංස්ථාවන්හි දී පීඩාවට පත් වී ඇති ආකාරය පිළිබඳ සාකච්ඡාවට භාජනය වූ න්‍යායාත්මක ධාරාවන් රාශියකගෙන් සමන්විත විය. ස්ත්‍රීවාදී විශ්ලේෂණය සහ වැඩ කාන්තාව නිසා ආරම්භවූවක් බවත්, කාන්තාවගේ නිදහස, පීඩාවට පත් නොවන සමාජ ව්‍යුහයක වැඩ කිරීමේ

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 175-197
ISSN 1800-1459

නිදහස, කාන්තාවන්ට හඬක් වීම, කාන්තාව හා සංවර්ධනය, කාන්තාවන්ගේ ක්‍රියාකාරකම්, කාන්තාවන්ට සමාජයෙන් ලැබිය යුතු තත්ත්වය හා ගරුත්වය, කාන්තාවගේ අයිතිවාසිකම් වැනි සාධක පදනම් කරගෙන ස්ත්‍රීවාදය ආරම්භ විය. ස්ත්‍රීවාදයේ ප්‍රධාන ගුරුකුල ලෙස ලිබරල් ස්ත්‍රීවාදය, රැඩිකල් ස්ත්‍රීවාදය, සමාජවාදී ස්ත්‍රීවාදය, මාක්ස්වාදී ස්ත්‍රීවාදය, කළු ස්ත්‍රීවාදය හා පශ්චාත් නූතන ස්ත්‍රීවාදය හඳුනාගත හැකිය (Dominelli, 1997:28-29). මෙම න්‍යායාත්මක ධාරාවන් සමග ස්ත්‍රීවාදයේ බහුවිධ ස්වරූපයන් හඳුනාගත හැකි වේ.

ලිබරල් ස්ත්‍රීවාදය මගින් මේරී වොල්ස්ටෝන්ක්‍රාෆ්ට් විසින් 1791 දී කාන්තා ප්‍රශ්නය කරා ව්‍යාප්ත කරමින්, මූලික වශයෙන් කාන්තාවන් සඳහා සම අයිතිවාසිකම් පිළිබඳ ප්‍රශ්නය මතු කළා ය. පසුව මෙයට ඡන්දය දීමේ අයිතිය, අධ්‍යාපනය ලැබීමේ අයිතිය හා රක්ෂාවල් කිරීමේ අයිතිය ද ඇතුළත් කරන ලදී. බෙටී ෆ්‍රීඩන් (1963) විසින් මේ ලිබරල්වාදී මතය යළි ඉදිරිපත් කරන ලදී (Dominelli, 1991:12). මෙහිදී ලිංග භේදය හේතුකොටගෙන වෙනස්කම් දුරුකරමින් සමාජයෙහි, නිදහස් වෙළඳපොළෙහි, තරග කිරීමට ගැහැණුන්ට පුළුවන්කම ලබා දීමයි. උපත් පාලනය සඳහා නිදහස හා පහසුකම්, මාතෘ නිවාඩු හා පොදු ළමා උවටැන් යනාදිය මේ පිළිබඳ නිදසුන් වේ (තිරුචන්ද්‍රන්, 2007:2). ලිබරල් ස්ත්‍රීන්ගේ අයිතිවාසිකම් පිළිගන්නා අතර ලිංගික භේදය හා අසමානකම් තේරුම් කළ හැක්කේ ධනවාදි නිෂ්පාදන විධිය සමග වන ඒවායේ සම්බන්ධකම් අනුව යයි අවධාරණය කිරීමට ඔවුන්ට වුවමනා ය. තවදුරටත් තර්ක කරන ඔවුහු, මේ අයිතීන් මගින් පමණක් කාන්තා විමුක්තිය සහතික නො වන බැව් කියති. රක්ෂාවල් කිරීම සඳහා සමාන අයිතියක් තිබීමෙන් පමණක් ම, රක්ෂාවල් ලැබීම හෝ සමාන වැටුප් හෝ සහතික නො වේ. සැබෑ සමානත්වය එමගින් සම්පූර්ණ නොවේ. ධනවාදි පවුල පිළිබඳ සංකල්පයෙනි. ඔවුන්ගේ මතය අනුව, ගැහැණුන්ගේ ඓතිහාසික පරාජයට හේතුව ජෛවවේදීය ප්‍රශ්නයක් නො වීය. එය අතිරික්තයක් බිහි කිරීම කරණකොටගෙන අවශ්‍ය වූ, දේපළ මෙන් ම ගැහැණුන් ද පුද්ගලික අයිතියට නතු වීම පිළිබඳ ප්‍රශ්නයක් විය. තම පීතෘත්වය නිර්ණනය කිරීමත්, අතිරික්තයක් බිහි කිරීම මගින් අත්කර ගත් පුද්ගලික දේපළ තම දරුවන්ට අයිති කර දීමත් සඳහා, පිරිමින්ට ගැහැණුන් සමාජමය නිෂ්පාදන කටයුතුවලට පිවිසීම කාන්තා විමුක්තිය සඳහා මග පාදන පූර්ව කොන්දේසිය වනු ඇතැයි යන එංගල්ස්ගේ මතයට ඔවුහු එකඟ වූහ (තිරුචන්ද්‍රන්, 2007:3 ). රැඩිකල් ස්ත්‍රීවාදීන්ගේ තර්කය වනුයේ, ගැහැණුන්ගේ යටහත්පහත්භාවය උද්ගත වන්නේ, නිෂ්පාදන විධියෙන් නොව, ප්‍රජනනයෙහි දී ගැහැණුන්ට පැවරෙන කාර්යභාරයෙන් හා එම කාර්යභාරය ව්‍යාප්ත වීමෙන් බිහි කෙරෙන, දරුවන් ඇතිදැඩි කිරීමේ හා ගෘහස්ත වැඩකටයුතුවල හිරවීමේ තත්ත්වයෙන් බවයි. පයර්ස්ටෝන් තර්ක කරන්නේ ගැහැණියකගේ ගර්භාෂයෙන් පිටත තාක්ෂණ ශිල්පමය ලෙස බිළිඳුන් බිහි කිරීම දක්වා තරම් දුරට, මේ විප්ලවය යා හැකි ය. ප්‍රජනනය මගින් ගැහැණුන්ගේ පීඩනය තව තවත් වැඩි කරන බව හා ගැහැණුන්ගේ යටහත්භාවය බිහි කරන බව අවධාරණය කළහ (Firestone, 1971:36). සමාජවාදී ස්ත්‍රීවාදීහු තර්ක කරන්නේ ගැහැණුන්ගේ ඓතිහාසික පරාජය නිෂ්පාදන විධිය සමග සම්බන්ධ කරන, එංගල්ස්ගේ න්‍යායයේ අප්‍රමාණවත්කම, ඔවුහු පෙන්වා දෙති (Eiseitein, 1979:197). සංස්කෘතික හා පාරිසරික මෙන් ම කළු ජාතික ස්ත්‍රීවාදය ආදිය ද හඳුනාගත හැකි ය. සමාන අයිතිවාසිකම් ඉල්ලා සරල න්‍යායකින් පටන් ගෙන විවිධ

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 175-197
ISSN 1800-1459

මතවාද ඔස්සේ ගොඩනැගුණු සමාජ දේශපාලන ව්‍යාපාරයක් ලෙස ස්ත්‍රීවාදය හඳුනාගත හැකි ය.

ශ්‍රී ලංකාව වැනි පෙරදිග රටවල තමන්ට හිමි තැන පිළිබඳ ව තවදුරටත් පවතින විවාදයේ ස්ත්‍රියට හිමි තැන සම තැන නොව නිසි තැන යන්නෙන් අර්ථ නිරූපණය කර ස්ත්‍රිය නැවත වතාවක් පුරුෂමූලික සමාජ සංස්ථාවන්හි දී අසරණභාවයට පත්කොට ඇත. එහිදී නිසි තැන ලෙස ඉස්මතු කරන්නේ ස්ත්‍රී ශරීරයක් හිමි වීම හරහා පුරුෂ මූලික සමාජය විසින් ස්ත්‍රියට ලබා දී ඇති ස්ථානය යි. එය ස්ත්‍රීවාදයට අදාළවන්නේ තනි තනිවමත්, කණ්ඩායමක් ලෙස යටපත් කිරීම හේතු කොට ගෙන තමන්ගෙන් ම පවතින පුරුෂ මූලික සමාජයට එරෙහි ව සමාජ දේශපාලන කතිකාවන් ගොඩ නැඟීමයි. ස්ත්‍රීවාදය දේශපාලන ව්‍යාපාරයක් ලෙස ශක්තිමත් ද යන්න අභියෝගයකට ලක්කළ යුතු කරුණක් වන අතර ශ්‍රී ලංකාව වැනි පෙරදිග රටවල් ආශ්‍රයෙන් මෙම කරුණ විමර්ශනයට ලක් කිරීමේ දී ශක්තිමත් ව්‍යාපාරයක් ලෙස ස්ථාපිත වී නොමැති බව පැහැදිලි වේ. ස්ත්‍රීවාදය පිළිබඳ අර්ථ නිරූපණය කිරීමේ දී පැහැදිලි වන්නේ කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ පීඩාවන් තුරන් කිරීම ස්ත්‍රීවාදය ලෙසයි. ශ්‍රී ලාංකේය ස්ත්‍රීවාදීන් මුහුණ දෙන අභියෝග සාකච්ඡා කිරීමේ දී ස්ත්‍රීවාදී ව්‍යාපාරය දෙස අවධානය යොමු කිරීම කාලෝචිත වේ. සියවස් එකහමාරක පමණ කාලයක් තිස්සේ ස්ත්‍රීවාදීන් විසින් විවිධ ප්‍රවේශ හරහා, සමාජීය ලෙස ස්ත්‍රීන්ට වෙනස් කොට සැලකීම පිළිබඳ කරුණු විමර්ශනය කොට මති මතාන්තර සමූහයක් ඉදිරිපත් කරනු ලැබ ඇත. ඒවායේ වර්ධනය නූතන ස්ත්‍රීවාදය බවට පත්ව තිබේ.

> "මුල් ම යුගයේ ස්ත්‍රීවාදීන් හා ස්ත්‍රීවාදී ව්‍යාපාරය පළමු රැල්ල ලෙසත්, 1960 ගණන්වලින් පසු ව්‍යාප්ත වූ ස්ත්‍රීවාදී ව්‍යාපාරය දෙවන රැල්ල ලෙසත් සලකනු ලැබේ. නූතන ස්ත්‍රීවාදය තුන්වන රැල්ල නමින් හඳුන්වන අතර, සමහර ස්ත්‍රීවාදීහු එසේ හැඳින්වීමේ අවශ්‍යතාවක් නොමැති බවට ද තර්ක කරති. මුහුදු රැල්ලට සමාන අයුරින් "රැල්ල" යන පදය ස්ත්‍රීවාදය හා එම ව්‍යාපාරයේ වර්ධන අවස්ථා හැඳින්වීම යොදා ගැනුණි" (ලියනගේ, 2006:42 ).

ස්ත්‍රීවාදී සිද්ධාන්තයන් ගොඩනැගීම පළමු අදියරයෙහි දී සිදුවූයේ පවත්නා සමාජ සම්මතයන් විවේචනය කරමින් ඒවායෙහි සිදුවන අසාධාරණය පෙන්වා දීමෙනි. ශ්‍රී ලංකාවේ ස්ත්‍රීවාදය හා සම්බන්ධ ගැටලු හා වර්තමාන අභියෝග සාකච්ඡා කිරීමට නම් ලෝකයේ ස්ත්‍රීවාදය පිළිබඳ හඳුනා ගැනීම අවශ්‍ය වේ. ස්ත්‍රීවාදය පළමු අදියර, දෙවන අදියර හා තෙවන අදියර සාකච්ඡා කිරීමෙන් මෙම දේශපාලන හා න්‍යායාත්මක ධාරාවන්ගෙන් ශ්‍රී ලංකාවේ ස්ත්‍රීවාදී ව්‍යාපාරය ද ආලෝකය ලබා ඇති බව අවබෝධ කරගත හැකි ය.

## ස්ත්‍රීවාදය: පළමු අදියර

ස්ත්‍රීවාදයේ පළමු අදියරෙන් සාකච්ඡා කරනු ලැබූයේ පුරුෂයා මූලික වූ ආර්ථිකය, දේශපාලනය වැනි සංස්ථා පිළිබඳ වැඩි වශයෙන් සාකච්ඡා වන අතර ස්ත්‍රිය මූලික වූ පවුල වැනි සංස්ථාවල වැදගත්කම යටපත් කිරීම පිළිබඳව යි. මාක්ස්, වෙබර්, ඩර්කයිම් වැනි ප්‍රධාන ලේඛකයන්ගේ රචනා තුළ වැඩි අවධානයක් යොමු

කර ඇත්තේ ආධිපත්‍ය, බලය, තර්කාන්විතභාවය ආදි වූ පොදු සමාජ සංස්ථාවන්ට අදාළ කාරණා මිස ස්ත්‍රිය ප්‍රධාන වශයෙන් දායක වන පෞද්ගලික සමාජ සංස්ථා සම්බන්ධ ඒවා නොවන බවයි.

ඩර්කයිම්, 19 වන සියවසේ තිබූ පිළිගැනීම් වලට ප්‍රකාශ කළේ සමාජයට ස්ත්‍රියගේ දායකත්වය රැඳී ඇත්තේ ඇයගේ ජෛව විද්‍යාත්මක ගතිලක්‍ෂණවල බවයි.

> "ස්ත්‍රිය වඩාත්ම 'ස්වභාවධර්මයට ආසන්න වූ ස්වභාව ධර්මයේ නිෂ්පාදනයක් බවයි. ඔහුට අනුව, පුරුෂයාට තම ස්වභාවධර්මයෙන් ලැබුන බලපෑම් බිඳ හෙලමින් "සමාජීය" ජීවිතයක් ගතකළ හැකි සමාජයේ නිෂ්පාදනයක් වේ" (Durkheim, 1984:11).

ඩර්කයිම්ගේ අදහස මතවාදයට ලක්වන ප්‍රකාශනයක් වන අතර මෙම අදහසට විරුද්ධ වූ ස්ත්‍රීවාදීන් ප්‍රකාශ කළේ එය සමාජ අසමානත්වය නිරූපණය කරන ප්‍රකාශනයක් ලෙසයි. ඩර්කයිම් වැනි සමාජ විද්‍යාඥයින් ඉදිරිපත් කළ කෘත්‍යවාදී ප්‍රවේශයක් නිසා කාන්තාව විසින් සමාජ පර්යාය පවත්වාගෙන යාමට සිදුකරන දායකත්වය පිළිබඳ ඔහු වැඩි අවධානයක් යොමු කරන්නට උත්සාහ ගෙන ඇති බව පෙනේ. ජෛව විද්‍යාත්මක කරුණු පදනම් කරගෙන ස්ත්‍රීපුරුෂ වශයෙන් සමාජ නිර්මාපකයන් ගොඩනැගීම නිසා ස්ත්‍රිය පීඩාවට පත්වන ආකාරය ස්ත්‍රීවාදයේ පළමු අදියරෙන් සාකච්ඡා කෙරේ. Simone De Beauvoir ප්‍රකාශ කරන අන්දමට "ස්ත්‍රීභාවය " යන්න ස්වාභාවික දෙයක් නොව පුරුෂ මූලික වූ සමාජමය හා ඓතිහාසික බලවේගයන්හි නිර්මාණයක් බවයි. ඇයගේ තර්කය වූයේ ස්ත්‍රීභාවය නම් වූ සංකල්පය ස්වාභාවික එකක් නොව උපතේ සිට ම සමාජ බලපෑම් මත "ඉගෙන ගන්නා ලද " එකක් බවයි. "ස්ත්‍රිය " ලෙස සමාජය දකින්නේ පුරුෂ මූලික සමාජයක් තුළ සමාජගත වීමේ ක්‍රියාවලිය මගින් නිර්මාණය වූ දෙයක් මිස ස්වභාවික දෙයක් නොවේ (De Beavoir, 1988:6). පවුල නැමති ඒකකය ගත් විට ද ස්ත්‍රියගේ සිතුම් පැතුම් හැසිරීම හා ආකල්ප අනුව පෙනී යන්නේ ස්ත්‍රියට උපතේ සිට ම එන බලපෑම මත ඉගෙන ගන්නා දෙයක් බවයි.

> "පවුල මගින් දරුවා ලබන මූලික සමාජානුයෝජනය ලිංග භේදය අනුව ස්වාමිපුරුෂයා හා බිරිඳ අතර ශ්‍රමය විභජනය වී ඇති ආකාරය පදනම් කරගත් එකකි. පවුලේ ප්‍රධාන කෘත්‍යයන් දෙක මේ ලිංග භේදය මත පදනම් වී ඇත. පුරුෂයා පිටත නැඹුරුවූත්, පවුල සමාජය සමග සම්බන්ධ කරන්නා වූත් කෘත්‍යන් ඉටුකරන අතර පවුල තුළට නැඹුරු වූ පවුල තුළ සමාජ සම්බන්ධතා කළමණාකරණය සම්බන්ධ කෘත්‍යන් ඉටුකරයි" (Cuff, 1990: 375).

බිරිඳ හා මව ලෙස ස්ත්‍රියගේ කෘත්‍යන් අභ්‍යන්තර ඒවා ලෙස සැලකෙනතාක් කල් පුරුෂයාට සාපේක්‍ෂව ඔවුන්ගේ අගය හීන වනු ඇත. මක්නිසාද යත් සමාජයේ තත්ත්වය මනින්නේ යමෙක් වෙත ඇති සම්පත්, සමාජ සබඳතා හා වෘත්තිය මත වන හෙයින් ස්ත්‍රිය "ගෘහීය වශයෙන් වෘත්තීන්ගේ ස්ථරායනයේ ඉතා පහළ මට්ටමක සිටින බැවිනි .

නමුත් ඇතැම් ස්ත්‍රීවාදීන්ගේ අදහස වූයේ පවුල තුළ ස්ත්‍රියගේ චරිතය අතහැරදැමීම නොව එය යළි නිර්වචනය කිරීම අවශ්‍ය බවයි. එනම් පවුල තුළ ස්ත්‍රිය ඉටුකරන

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 175-197
ISSN 1800-1459

කෘත්‍යන් ද පුරුෂයා පවුලෙන් පිටත දී තම ශ්‍රමය සැපයීම මගින් කරන "වැඩ" වලට ම සමාන කළයුතු බවයි. නිවස තුළ කාන්තාව ඉටුකරන මෙහෙවර සම්බන්ධ වූ "ගෘහස්ථ ශ්‍රමය" පිළිබඳ තර්කය 1970 ගණන්වල ස්ත්‍රීවාදීන් අතර ඉතා ප්‍රචලිත සිද්ධාන්තයක් විය. සමාජ ආර්ථිකයේ කොටසක් වශයෙන් ස්ත්‍රිය නිවස තුළ කරන මෙහෙවරට වටිනාකමක් ලබාගැනීම මෙහි අරමුණ විය. ඉවුම් පිහුම් සේදීම් පිරිසිදු කිරීම් ආදි සියල්ල වෙහෙසකාරී මෙන් ම ඉතා වැදගත් කාර්යන් හෙයින් ඒවා පුරුෂයනගේ ශ්‍රම දායකත්වයට ම සමාන ඒවා බව ස්ත්‍රීවාදීන්ගේ අදහස විය. කෘත්‍යවාදී තර්කයට ප්‍රතිවිරෝධය දැක්වූ ස්ත්‍රීවාදීන් ප්‍රකාශ කළේ ගෘහස්ථ ශ්‍රමය සමාජයේ හඳුනාගැනීමකට ලක් නොවුව ද, සමාජයේ හා ආර්ථිකයේ නිසි ක්‍රියාත්මකවීම සඳහා ස්ත්‍රීන් කරන කෘත්‍යන් අත්‍යවශ්‍ය බවයි. මාක්ස්වාදී ස්ත්‍රීවාදීන් දැක්වූයේ ශ්‍රමය පිළිබඳ මාක්ස්ගේ සංකල්පය වඩාත් විවෘත එකක් කළ යුතු බවයි. එනම් ගෘහණියගේ මෙහෙවරට පින්සිදුවන්නට කාර්මික ධනවාදී ආර්ථිකයේ ශ්‍රමිකයා පිරුණු කුසින් ද ඇඳුමින් පැලඳුමින් ද යහපත් මානසිකත්වයකින් ද වැඩකිරීමට පෙලඹෙන හෙයින් ඒ සඳහා ස්ත්‍රිය දරණ වෙහෙස, ශ්‍රම බලකායේ කොටසක් ලෙස හඳුනාගත යුතු බවයි.

තවත් තර්කයක් වූයේ තම ස්වාමියාට හා දරුවන්ට ඇති ස්නේහය හා බැඳීම හේතුකොටගෙන ස්ත්‍රිය තමන් කරන මෙහෙවර ශ්‍රමය සැපයීමක් ලෙස නොව තම යුතුකමක් ලෙස සලකන හෙයින් එය "ශ්‍රමය" යැයි නම් කිරීම වැරදි බවයි. තම මෙහෙවරට ඔවුන්ට ගෙවීමක් නොලැබුන ද ඔවුන් ආත්ම තෘප්තියක් ලබන නිසා එය සේවා සැපයීමක් ලෙස ඔවුන් නොසලකන බව මෙම තර්කයේ අර්ථයයි. ඕක්ලිගේ "Sociology of house work" නම් කෘතියෙහි මීට ප්‍රතිපිළිතුරු දී ඇත. කාන්තාවන්ගේ ගෘහස්ත මෙහෙවර පිළිබඳ ප්‍රායෝගික අධ්‍යයනයක් මගින් ඕක්ලි සොයාගත්තේ කාන්තාවන්ගෙන් ඉතා සුලු කොටසක් පමණක් ධනාත්මක ලෙස ගෙදර දොරේ වැඩ දෙස බලන බවයි. දුෂ්කර වූත් කරදරකාරී වූත් ගෙදරදොරේ වැඩ සතුටින් ඉටුකළ ගෘහණියන් සංඛ්‍යාව ඉතා අඩු වූ අතර ගෙදරදොරේ වැඩ පහසු කරන රෙදි සෝදන යන්ත්‍ර ශීතකරන විදුලි උඳුන් ආදිය සඳහා ඇති ඉල්ලුමෙන් ම මේ ප්‍රකාශය තහවුරු වේ. ඕක්ලිට (1974:72) අනුව ගෙවීම් ලබන ශ්‍රම දායකත්වය මෙන් ම ගෘහණියන් තම ගෙදර වැඩ පිළිබඳ දරන්නේ මධ්‍යස්ථභාවයකි.

## දෙවන අදියර: ස්ත්‍රීවාදී ප්‍රතිපත්තිය සිද්ධාන්තය

මෙහි අර්ථය වන්නේ යම්කිසි සමාජ කොට්ඨාසයක් තේරුම් ගැනීමට නම් එහි සාමාජිකයෙකු වශයෙන් අත්දැකීම් ලබාගැනීම අත්‍යවශ්‍ය බවයි. මාක්ස් ප්‍රකාශ කරන අන්දමට කම්කරු ජනයාගේ අත්දැකීම් අනිවාර්යයෙන් ම ධනවාදී ආර්ථිකය තේරුම් ගැනීමට හොඳ තෝතැන්නක් බවයි. ධනවාදී අර්ථ ක්‍රමයෙහි අසාධාරණකම් වැඩිපුරම විඳ දරා ගන්නේ ධනවාදී අර්ථ ක්‍රමයෙහි අසාධාරණකම් වැඩිපුරම විඳදරාගන්නේ කම්කරු පන්තිය හෙයින් එහි අනිවාර්ය ස්වභාවය ඔවුන්ට මනාව තේරුම් ගැනීමට හැකිවන බවයි. මේ තර්කය ස්ත්‍රීවාදීන් විසින් සම්පූර්ණයෙන් ම යොදාගත් අතර ඔවුහු කම්කරු පංතිය වෙනුවට ස්ත්‍රිය යන වචනය ද ධනවාදය වෙනුවට පුරුෂමූලික සමාජය යන්න ද යොදා ගත්හ. එහි අර්ථය වූයේ ස්ත්‍රියට සමාජයේ ලක්‍ෂණ තේරුම් ගැනීමට වැඩි හැකියාවක් තම යටපත් වූ ස්වභාවය මගින් ලැබී ඇති බවයි. පුරුෂයකුට තමා සිටින ස්ථානය අනුව පිතෘමූලික සමාජයක

ඇතැම් ලක්ෂණ නොපෙනී යාමට පුලුවන. පුරුෂමූලික සමාජයේ බලපෑම්වලට පිරිමියා යටත් නොවේ. එනිසා එය තේරුම් ගැනීමට අවශ්‍ය අත්දැකීම් ඔහුවෙත නැති හෙයින් එවන් සමාජයක් තේරුම් ගැනීමට යොදා ගත යුතු ක්‍රමවේදය ගැන ඔහුට හොඳින් අවබෝධ කරගත නොහැක. අනිත් අතට එසේ පුරුෂයන් විසින් ගොඩනගා ගන්නා ලද යම් ක්‍රමවේදයක් වේද, එය ස්ත්‍රීන් තේරුම් ගැනීමට පාවිච්චි කිරීම ද අරුත්සුන් කටයුත්තකි.

ප්‍රතිපත්තිමය න්‍යාය ස්ත්‍රීවාදීන් හා ස්ත්‍රීවාදීන් නොවන අයගේ විවේචනයට පාත්‍ර වූයේ එහි දී දැනට පවතින පුරුෂමූලික එළඹුම් සියල්ල ප්‍රතික්ෂේප කරනු විනා යම් න්‍යායක් ගොඩනැගීමේ දී එය සංසන්ධනය කිරීමට යම් මිම්ක් නොදක්වන හෙයිනි. කාන්තාවගේ ප්‍රතිපත්තිය යන්න සෑම කාන්තාවට ම පොදු එකක් ලෙස සැලකීම කොතරම් සාධාරණ ද? මැද පන්තියේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලද සුදු අමෙරිකානු ස්ත්‍රියකගේ සමාජ ස්ථානගත වීම අධ්‍යාපනය නොලත් දුගී කලු ස්ත්‍රීයකගේ සමාජ ස්ථානගත වීමෙන් වෙනස් ය. එසේ නම් කාන්තාවගේ අත්දැකීම් යන්න ඒකීය එකක් නොව වර්ණාවලියකින් ම සමන්විත එකකි. මෙය ආගම්, ජාති, කුල ආදි විවිධ ස්ථරායනයන් අනුව වෙනස්වීමට ඉඩ ඇත. මේ සියලු වෙනස්කම් ඇති ස්ත්‍රීන් එකම ආකාරයක යටපත් කිරීමකට ලක් වේ යැයි ප්‍රකාශ කිරීම ප්‍රායෝගික නැත. මේ නිසා ප්‍රතිපත්තිවාදී න්‍යාය ගෙන ආ සුදුජාතික, මධ්‍යම පාංතික විශ්වවිද්‍යාලය පාදක කරගත් කාන්තාවන් තමන් අනෙක් සියලු ම කාන්තාවන් නියෝජනයට සුදුසු යැයි සිතීම පිළිබඳ දැඩි ලෙස විවේචනයට පාත්‍ර විය. ඒ අනුව පෙනෙන්නේ සියලු ම කාන්තා ව්‍යාපාරවලට එය වටා ඒකරාශිවීමට තරම් තාර්කික මූලධර්මයක් බිහිකිරීමට ප්‍රතිපත්තිවාදී න්‍යායට නොහැකි වූ බවයි. ප්‍රතිපත්තිවාදී න්‍යාය තුළ පදනම්වාදී ගතිලක්ෂණ ලිංගිකත්වය මත පදනම් වූ සමාජමය නිර්වචන ප්‍රතික්ෂේප කරන්නේ කුමක් ද? ඒ ජෛව විද්‍යාත්මක ලක්ෂණ ද? සමාජයේ අත්දැකීම් ස්ත්‍රියගෙන් ස්ත්‍රියට වෙනස් වේ. මේ නිසා ජෛවවිද්‍යාත්මක ලක්ෂණ ස්ත්‍රීවාදයේ පදනම ලෙස ගත හැකි වුවත් එවිට එය අනිවාර්ය ලක්ෂණවලින් හෙබි එකක් යැයි විචාරකයන් හංවඩු ගසනු ඇත.

## තුන්වන අදියර: පශ්චාත් නූතනවාදී ස්ත්‍රීවාදය

ඉහත සඳහන් දුර්වලකම්වලට පිළියම් සෙවීමේ ප්‍රතිඵලයක් ලෙස ස්ත්‍රීවාදයේ තුන්වන අදියර ඇරඹුණි. මෙම අදියර අතික්‍රමණ අදියර ලෙස නම් කරන අතර ස්ත්‍රිය යන්නට ස්ථිර අර්ථදැක්වීමක් කළ නොහැකි බවයි. පශ්චාත් ව්‍යුහවාදීන්ගේ අදහසට අනුව යමින් පශ්චාත් නූතනවාදී ස්ත්‍රීවාදයට අනුව ස්ත්‍රිය යනු එක් අනන්‍යතා කණ්ඩායමකට සීමාකළ නොහැකි තරම් වූ විවිධ ලක්ෂණවලින් හෙබි කොට්ඨාසයකි. උදාහරණයක් ලෙස ලිංගයකින් අනිත් ලිංගයට මාරුවන ස්ත්‍රීන්/ පුරුෂයන් ඇත. බට්ලර් විසින් Sex-gender යන දෙකෙහි වෙනස ප්‍රතික්ෂේප කරයි. ඊට හේතුව ලෙස දක්වන්නේ මෙම වෙනස අනුව ශරීරය නම් වූ දෙයක් මත සමාජය විසින් කළ බලපෑම්වල ප්‍රතිඵලයක් ලෙස ලිංගික අනන්‍යතාව ඇති වේ යන පදනම පිළිගත නොහැකි වීමයි. ශරීරය නම් සංකල්පය ද එක් අතකින් සංස්කෘතිය මගින් නිර්මාණය කරන ලද සංකල්පයකි. ඒ අනුව බලන කල ලිංගයකින් යුක්ත ශරීරය හා ලිංගිකත්වය යන සංකල්පය යන දෙක ම සමාජයේ ම නිර්මාණය

යි. ඔනිසා බට්ලර් ප්‍රකාශ කරන්නේ ලිංගික අනන්‍යතාව සම්පාදක ස්වභාවය අනුව තීරණය කළ යුතු බවයි. ෆුකෝල්ට් අනුව යමින් ඇය ප්‍රකාශ කරන්නේ ලිංගිකත්වය යන්න භාෂාමය හා අනෙකුත් ව්‍යවහාරයන් මගින් ඉෂ්ට කරන දෙයක් බවයි. ඊට හේතුව වන්නේ ලිංගික අනන්‍යතාව තීරණය වන ක්‍රියාදාමය භාෂාමය එකක් වීමයි. එහි දී විවිධ ව්‍යවහාරයන් ඉස්මතුවීමට හෝ යටපත් වීමට පුලුවන. එම නිසා ඇගේ අදහස වන්නේ "ස්ත්‍රීන් පිළිබඳ" විවිධ ආකාරයෙන් කතා කළ හැකි බවයි. ස්ත්‍රීන් නිර්වචනය කිරීම ජෛවවිද්‍යාත්මක සංකල්ප ද වෙනස් කළ හැකි බවයි.

බට්ලර්ගේ මෙම තර්කය දේශපාලනික වශයෙන් ස්ත්‍රීවාදීන්ට ඉතා වැදගත් ය. මක්නිසාද යත් ශක්තිමත් ස්ත්‍රීවාදී දේශපාලනයක් උදෙසා ස්ත්‍රිය යන ඒකීය අනන්‍යතා සංකල්පයක් අත්‍යවශ්‍ය වේ යන තර්කය මෙහිදී බිඳ වැටෙන හෙයිනි. මෙම ස්ත්‍රිය යන පදයේ ඒකීයත්වය බිඳහෙලීම මගින් සෑම ආකාරයක ම ස්ත්‍රීන් තමන් වටා ඒකරාශී කර ගැනීමේ පහසුවක් ස්ත්‍රීවාදීන්ට ඇත.

ඒ අනුව ස්ත්‍රීවාදී දේශපාලනයට විශ්වීය පදනමක් නැත. එයට පොදු අත්දැකීම් පාදක කරගෙන සාමූහික ක්‍රියාමාර්ග සාධාරණීයකරණය කළ නොහැක. දේශපාලනික ක්‍රියාමාර්ග ගත යුත්තේ විවිධාකාර වූ අනන්‍යතා සැලකිල්ලට ගෙනයි. මෙම පශ්චාත් නූතනවාදී එළඹුම මගින් ස්ත්‍රීවාදයට දේශපාලනික ව්‍යාපාරයක් ලෙස ඇති ස්ථානය පිළිබඳ යලි පොළඹවන ලදී. 1990 දශකය වන විට කාන්තා ව්‍යාපාර බොහොමයක් මන්දගාමී ස්වරූපයට පත්ව තිබුණි. මෙවන් තත්ත්වයක් මත පශ්චාත් නූතනවාදීන් ස්ත්‍රීවාදී ව්‍යාපාරයන්ට වඩාත් ප්‍රායෝගික ගමන් මාර්ගයකට මගපාදා දෙනු ලැබී ය.

පශ්චාත් නූතනවාදී ස්ත්‍රීවාදය ස්ත්‍රීවාදයේ යම් යම් මතවාදයන් අභියෝගයට ලක් කළ රැල්ලක් ලෙස හඳුනා ගත හැකි ය. ඊට හේතුව වන්නේ ස්ත්‍රීවාදය පිළිබඳ විවිධ අත්දැකීම් පදනම් කරගෙන විවිධ ආකාරයෙන් සාකච්ඡා කළ හැකිය. Sex-gender වැනි සාධක පදනම් කරගෙන ගොඩනැගෙන විවිධත්වයත් ඒකීයත්වයක් පදනම් කරගෙන ගොඩනැගෙන සමාජ මතවාදයන්ට ස්ථිර අරුත් දැක්වීමක් සිදුකළ නොහැකි බැවින් ය. ස්ත්‍රීවාදය දේශපාලන ව්‍යාපාරයක් ලෙස වැදගත් වීමට මෙම අත්දැකීම්වල පවතින විවධත්වය වැදගත් වේ. උදාහරණයක් ලෙස දැක්වුවහොත් ග්‍රාමීය ස්ත්‍රියගේ අත්දැකීම් නගරික ස්ත්‍රියගේ අත්දැකීම්වලට මුළුමනින් ම වෙනස් වේ. අනෙක් අතට පංතිය, කුලය, ජනවාර්ගිකත්වය මෙන් ම අධ්‍යාපනය වැනි සාධක ද පදනම් කරගෙන ස්ත්‍රියගේ අත්දැකීම් විවධ වේ.

> "ස්ත්‍රීන් නිර්වචනය කිරීමට යොදා ගන්නා ජෛව විද්‍යාත්මක (Sex) සංකල්ප ද වෙනස් කළ හැක. උදාහරණයක් ලෙස ලිංගයකින් අනෙක් ලිංගයට මාරුවන ස්ත්‍රීන්/ පුරුෂයන් ඇත. බට්ලර් විසින් ස්ත්‍රී පුරුෂභාවය – ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන දෙකෙහි වෙනස ප්‍රතික්ෂේප කරයි. ඊට හේතුව ලෙස දක්වන්නේ මෙම වෙනස අනුව ශරීරය නම් වූ දෙයක් මත සමාජය විසින් කළ බලපෑම්වල ප්‍රතිපත්තියක් ලෙස ලිංගික අනන්‍යතාව ඇති වේ යන පදනම පිළිගත නොහැකි වීමයි" (Cuff, 1990:384).

"ශරීරය නම් සංකල්පය ද එක් අතකින් සංස්කෘතිය මගින් නිර්මාණය කරන ලද සංකල්පයකි. ඒ අනුව බලන කල ලිංගයකින් සහිත ශරීරය හා ලිංගිකත්වය යන

*ISSN 1800-1459*

සංකල්ප දෙකම සමාජයේ ම නිර්මාණයක් වේ. ඒ නිසා බට්ලර් ප්‍රකාශ කරන්නේ ලිංගික අනන්‍යතාව සාම්ප්‍රදායික ස්වභාවය අනුව තීරණය කළ යුතු බවයි. ෆුකෝල්ට් ප්‍රකාශ කරන්නේ ලිංගිකත්වය යන්න භාෂාමය හා අනෙකුත් ව්‍යවහාරයන් මගින් ඉෂ්ට කරන දෙයක් බවයි. ඊට හේතුව දක්වන්නේ ලිංගික අනන්‍යතාව තීරණය වන ක්‍රියාදාමය භාෂාමය එකක් වීමයි. එහිදී විවධ ව්‍යවහාරයන් ඉස්මතුවීමට හෝ යටහත් වීමට පුළුවන" (Cuff, 1990:385).

> "මනෝවිශ්ලේෂණාත්මක ප්‍රවේශයන් යොදා ගෙන ද විවිධාකාර අනන්‍යතා සනාථ කරගත හැක. මෙහිදී ජීව විද්‍යාත්මක ශරීරයේ ම සැකැස්ම තුළ ඇතිවන වෙනස්කම් (True/ pseudo hermaphrodites) එනම්, එක් ශරීරයක් තුළ ලිංග දෙකට ම අදාළ අවයව පිහිටීම" (පෙරදිග සුළං, 2008:24).

> "මෙහි දී ජීව විද්‍යාත්මකව ස්ත්‍රී ශරීරයක් සහිත නමුත් තමන්ගේ ලිංගිකත්වය පිරිමි ලෙස සලකන අය හා පිරිමි ශරීරයක් සහිත ව තමන් ස්ත්‍රී ලෙස සලකන අය හරහා මෙම අභියෝගය එල්ල වේ. කතිකාව මගින් ලිංග නිර්ණය (The sexuality) ජීව විද්‍යාත්මක ව ශරීරයේ ඇති ලකුණ නොව, බාහිර සමාජ කතිකාවේ ප්‍රතිඵලයක් ලෙස පුද්ගලයෙකුගේ ලිංග නිර්ණය වන බව ය. ඒ අනුව බාහිර සමාජයේ පිරිමින් සඳහා වන කතිකාවට ඇතුළු වීම නිසා ස්ත්‍රීන් ද ලෙස ලිංග නිර්ණය සිදු වේ. ජීව විද්‍යාත්මක ශරීරය මත සමාජ කතිකාව බලපෑම් මගින් ලිංග නිර්ණය වන බව මෙම අදහසයි" (පෙරදිග සුළං, 2008:25).

මේ එක් අදහසකින්වත් පුරුෂ හා ස්ත්‍රී මනෝභාවයන්ට කිසිදු හේතුවක් පැහැදිලි කිරීමක් ඉදිරිපත් නොකරයි. ක්‍රමවේදයේ කළමනාකරණය හෙවත් ලිංග වෙනස පිළිබඳ මනෝවිශ්ලේෂණාත්මක අදහස (The Sexuation) මනෝ විශ්ලේෂණය පුද්ගලයාගේ ආත්මීය කාරණා මගින් ඔහුගේ ඇයගේ ලිංගය නිර්ණය කිරීමට යෝජනා කරයි (එම). මෙහිදී මනෝවිශ්ලේෂණය යෝජනා කරන්නේ කෙනෙක් තමන්ගේ ප්‍රමෝදය සංවිධානය/ කළමණාකරණය කරන ආකාරය අනුව මිනිස් වර්ගයා ස්ත්‍රී/ පුරුෂ ලෙස දෙකට බෙදෙන බව ය.

මනෝවිශ්ලේෂණය පිළිබඳ විග්‍රහය මගින් පශ්චාත් නූතනවාදී අදහස් සමග ගැබ් වී ඇති බව පෙනේ. නූතනවාදි එළඹුම මගින් ස්ත්‍රීවාදයට, දේශපාලනික ව්‍යාපාරයක් ලෙස ඇති ස්ථානය පිළිබඳ යළි සිතීමට පොළඹවන ලදී. 1990 දශකය වන විට කාන්තා ව්‍යාපාර බොහෝමයක් මන්දගාමී ස්වරූපයට පත්ව තිබුණි. ශ්‍රී ලංකාව වැනි රටවල ස්ත්‍රීවාදය සම්බන්ධයෙන් ද ගත්විට ද පෙනී යන්නේ මන්දගාමී ස්වරූපයක් ගන්නා ආකාරය යි.

ස්ත්‍රීවාදය සම්බන්ධ ඇති න්‍යායාත්මක ධාරාවන් ගත්විට ද ලිබරල් ස්ත්‍රීවාදය, රැඩිකල් ස්ත්‍රීවාදය, සමාජවාදී ස්ත්‍රීවාදය, මාක්ස්වාදී ස්ත්‍රීවාදය මෙන් ම කළු ස්ත්‍රීවාදය ද ඉංදියාව වැනි රටවල සාකච්ඡා කළ පාරිසරික ස්ත්‍රීවාදය යම් යම් මතවාද ශ්‍රී ලංකාව වැනි රටවල ස්ත්‍රීවාදී ව්‍යාපාරය පෝෂණය වීමට බලපා ඇත. නමුත් ශ්‍රී ලංකාව වැනි රටවල ද රැඩිකල් ස්ත්‍රීවාදය දැඩි ලෙස අභියෝගයට ලක් වූ ව්‍යාපාරයක් වේ. ශ්‍රී ලංකාව වැනි රටවල දක්නට ලැබෙන සමාජ සංස්කෘතික පසුබිම හා පුරුෂාධිපත්‍යය ඇගයුම් හා ස්ත්‍රියට තවදුරටත් හිමි තැන ආදිය

නිසා ස්ත්‍රීවාදී ව්‍යාපාරය අභියෝගයට ලක් වූ ව්‍යාපාරයක් ලෙස අර්ථ දැක්විය හැකි ය.

## ස්ත්‍රීවාදය හා ශ්‍රී ලංකාව වැනි පෙරදිග රටවල ඇති ගැළපීම

"ස්ත්‍රිය මානව සත්ත්වයෙක්" ලෙස පිළිගැනීම සඳහා සිදුකරන ලද විමුක්ති අරගල ලෝකයේ මෙන් ම පෙරදිග රටවල ද දක්නට ලැබුණු සංසිද්ධියකි. "ස්ත්‍රී විමුක්තිය පිළිබඳ අදහස් අපරදිග ද චින්තනයක් පමණක් ද යන මතවාදයෙන් බැහැරව සිතීමට ඉඩකඩ සලසන බුද්ධක නිකායේ එන ථේරී ගාථා විමර්ශනය කිරීමේ දී හඳුනාගත හැක. ස්ත්‍රී විමුක්තිය පිළිබඳ කතිකාව නිදහස්කාමී චින්තනය සමග වර්ධනය වූ චින්තන ධාරාවක් වුවත් ක්‍රි.පූ.6 වෙනි සියවස් තුළ බුද්ධකාලීන සමාජය තුළ කාන්තා විමුක්තිය පිළිබඳ ප්‍රකාශනයක් ලෙස ථේරී ගාථා හඳුනාගත හැක (ජයසේන, 2010:172).

"බොහෝ පෙරදිග රටවල සමාජ, ස්ත්‍රීවාදය බටහිර සංකල්පයක් ලෙස සලකා බැහැර කිරීමට උත්සාහ ගනී. එහෙත් ඕනෑම රටක හෝ මානව වර්ගයක ඉතිහාසය දෙස බැලුවහොත්, ස්ත්‍රී විමුක්තිය සඳහා වූ අරගල දක්නට ලැබේ. එක්කෝ ස්වාධීනතා අරගලවලට ස්ත්‍රීන් විවිධ හැඩයන් ගත්ත ද, එය සමස්ත ලෝකයට ම පොදුය. එම පීඩනයෙන් මිදීමට බටහිර මෙන් ම පෙරදිග ස්ත්‍රීනුත්, උතුරේ මෙන් ම දකුණේ ස්ත්‍රීනුත් විවිධ අයුරින් ක්‍රියාත්මක වූ අයුරු සාක්ෂි සහිතව ඉතිහාසයෙන් ඕනෑතරම් සොයාගත හැකි ය" (ලියනගේ, 2006:73 ).

ස්ත්‍රීවාදී ව්‍යාපාරය සමාජ දේශපාලන ව්‍යාපාරයක් ලෙස ගොඩනැගුනේ ම සමාජ සංස්කෘතිය මගින් සිදු කරනු ලැබූ මර්දනකාරී මෙන් ම හිංසාකාරී ක්‍රියාදාමයන් ය.

"ජනතාවගේ ආගම්වල (හින්දු ආගමේ හා ඉස්ලාම් ධර්මයේ) නාමයෙන් අනුගමනය කරන ලද මර්දනකාරී හා මිලේච්ඡ ව්‍යවහාරයන් ගැන අවබෝධයක් ලැබීමෙන්, දෘෂ්ටිය හැඩ ගැසිණ. කාන්තාවන්ගේ තත්ත්වය මේ ආගම් දෙක සමඟ, ඒවා ඇදහූ අන්දම සමග, වෙන් නො කළහැකි සේ බැඳී තිබිණ" (තිරුචන්ද්‍රන්, 2007:15).

ඉන්දියාව වැනි රටවල සති පූජා, ළමා විවාහ, දෑවැද්ද ලිංගච්ඡේදනය වැනි ස්ත්‍රියට තිබූ හිංසාකාරී ක්‍රියාදාමයන් ද පවුල හා අනෙකුත් සමාජ සංස්ථාවල කාන්තාවන්ට එරෙහිව තිබෙන හිංසාකාරී ක්‍රියාදාමයන් ද හේතුකොට ගෙන ස්ත්‍රීවාදය පිළිබඳ කතිකාවක් නිදහස පිළිබඳ චින්තනයත් සමග ඉංදියාව වැනි රටවල ගොඩනැගුණි.

"එහෙත් නූතන සමාජ හා දේශපාලන දෘෂ්ටිවාදයක් ලෙස හා විධිමත්ව සංවිධානය වූ ව්‍යාපාරයක් ලෙස ස්ත්‍රීවාදය උපත ලැබුවේ බටහිර යුරෝපය තුළ බව පිළිගත යුතු වේ. 19 වැනි සියවසේ දී ස්ත්‍රීවාදයේ ව්‍යාප්තිය ඇරඹුනත්, ස්ත්‍රී අයිතිවාසිකම් පිළිබඳ අදහස් හා අධ්‍යයන එයට පෙරත් බටහිර යුරෝපයේ සහ උතුරු ඇමෙරිකාව තුළ ප්‍රකාශයට පත්වී තිබිණි.

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 175-197
ISSN 1800-1459

එසේම මුල් කාලවලදී ස්ත්‍රීවාදය සම්බන්ධ වූයේත් බටහිර මධ්‍යම පංතික ස්ත්‍රීන් හා විශේෂයෙන් ම ශාස්ත්‍රීය අධ්‍යයනවල නිරත වූ ස්ත්‍රීන් සමඟ ය. එහෙයින් ස්ත්‍රීවාදයට පදනම් වූ සමාජ පසුබිම් සාධක හා ස්ත්‍රීන්ගේ අත්දැකීම් ද බෙහෙවින් බටහිරට සම්බන්ධ ඒවා විය. නමුත් සියවස් තුනක් පමණ කාලය තුළ දී, ස්ත්‍රීවාදී දෘෂ්ටිය මෙම බටහිර සමාජයෙන් ඇත් වූ සමාජ පසුබිම් පදනම් කර ගන්නා තත්ත්වයකට ද වර්ධනය වී ඇත. එසේම බටහිර වුවත්, පෙරදිග වුවත්, සමාන අයුරින් ස්ත්‍රීන්ට බලපාන පීඩනය, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, ස්ත්‍රී දූෂණ, ලිංගික අතවර, ප්‍රසූත නිවාඩු හා සම වේතන වැනි කරුණු වෙනුවෙන් එක් කටහඬක් නැගිය හැකි ජාත්‍යන්තර මට්ටමේ ව්‍යාපාරයක් බවට ස්ත්‍රීවාදය පත්වී ඇත" (ලියනගේ, 2006:73-74).

ස්ත්‍රීවාදය දේශපාලන ව්‍යාපාරයක් ලෙස ගොඩනැගීමට නිදහස් ව්‍යාපාරයන්ගේ බලපෑමක් සිදුවුව ද මෙය ධනවාදී සංසිද්ධියක් ලෙස හඳුනාගත හැකි ය.

"එක්තරා පංතියක සාමාජිකයන්ගේ ජීවන ශෛලීන් මදක් වෙනස් කිරීම අදහස් කර ගත් ධනවාදී සංසිද්ධියක් විය. එය සමාජයේ පැවති පීතෘ මූලික ව්‍යුහයන්ට විරුද්ධ ව එල්ල වුණු ප්‍රචණ්ඩ අභියෝගයක් නොවීය. ගැහැණුන්, සම්ප්‍රදායයන්ගේ හා ඉන්දියානු ප්‍රවේණි පරිසරයේ සීමාවන් තුළ රැඳී සිටීම සහතික කිරීම වස්, මව හා භාර්යාව පිළිබඳ පාරම්පරික ප්‍රතිබිම්බයන් නිරතුරු ව උපයෝගී කර ගනු ලැබිණ. එහෙත් සමස්තයක් වශයෙන් ව්‍යාපාරය තුළ වූ ස්ත්‍රීවාදී අදහස් තක්සේරු කිරීමක්, මින් අදහස් නො කෙරේ. පතිවත රැකීම ගැහැණුන්ගෙන් පමණක් බලාපොරොත්තු වීමට විරුද්ධ වීම, වැන්දඹුවකට යළි විවාහ වීමේ අයිතියත්, ගැහැණියකට දික්කසාද වීමේ අයිතියත් ඉල්ලා සිටීම යනාදිය, ගැහැණුන් මෙන්ම පිරිමින් ද අතර, ව්‍යක්ත වාද විවාදවලට බඳුන් වූ හා මැනවින් ලේඛන ගත කරනු ලැබ ඇති ස්ත්‍රීවාදී අදහස් වේ" (තිරුචන්ද්‍රන්, 2003:16).

විශේෂයෙන් ම ස්ත්‍රීවාදය ධනවාදී පංතියක ප්‍රකාශනයක් ලෙස දක්වන්නේ පීතෘ මූලික ව්‍යුහයට බලපෑමක් සිදු නොකර කාන්තාවන්ගේ විවාහය සම්බන්ධ ගැටලු හා පාරම්පරික කාන්තා ප්‍රතිරූපයට එල්ල වුණු විරෝධයක් නිසායි.

වසර ගණනාවක් පාරම්පරික පුරුෂ මූලික ආධිපත්‍යයට ද ඇගයුම්වලට කරන අභියෝගය නිසා ශ්‍රී ලංකාවේ ස්ත්‍රීවාදය විවේචනයට භාජනය කර ඇත.

"මන්ද, වසර ගණනක් තුළ දී සමාජගත වූ විශ්වාස පද්ධතියක් ස්ත්‍රීවාදය විසින් විචාරයට ලක්කරන බැවිනි. එසේම, පුරුෂයින් කේන්ද්‍රගත කරගත්, පුරුෂයින් විසින්ම නිර්මාණය කරන ලද දෘෂ්ටිවාද, පුරුෂයින් විසින් ව්‍යාප්ත කිරීමේ දී, බහුතර පුරුෂයින්ගේ අභියෝගයට ලක් නොවේ. එහෙත් ස්ත්‍රීවාදයෙන් මෙම පුරුෂමූලික සමාජය අභියෝගයට ලක්වීම කාලාන්තරයක් තිස්සේ ඔවුන්ට විශේෂයෙන් උරුම වූ තත්ත්වයන් වෙනස් කිරීමට දරන උත්සාහයක් ලෙස සැලකීම ඒ හමුවේ ඇති බැරෑරුම් ගැටලුවයි. එසේම බටහිර නොවන රටවල වඩාත් තදින් මුල්බැසගෙන ඇති පවුල් සංස්ථාවේ ඒකීය භාවයට හා පැවැත්මට මෙන්ම මව හෝ බිරිඳගේ භූමිකාවට ස්ත්‍රීවාදී අදහස් නිසා හානියක් සිදු වී, එය දෙදරා

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 175-197
ISSN 1800-1459

යන්නේය යන මතවාද ඉස්මතු වී ඇති තවත් ගැටළුවකි" (ලියනගේ, 2006:77).

මෙවන් මතවාද තවදුරටත් ශ්‍රී ලංකාව වැනි රටවල ස්ථාපිත වී තිබීම නිසා ස්ත්‍රීවාදය අභියෝගයට ලක් වේ. නමුත් කිසිවිටකත් ස්ත්‍රීවාදීන් පුරුෂ විරෝධී තත්ත්වයක් නිර්මාණය කිරීමට උත්සාහ නොගනී. ලියනගේ (2006:77) දක්වන ආකාරයට ස්ත්‍රීවාදීන් අවධාරණය කරන්නේ පුරුෂයාට සමාන අයුරින් පවුල තුළ මෙන් ම පොදු කටයුතු වලදීත්, ස්ත්‍රීන්ට අයිතිවාසිකම් හා ඉඩප්‍රස්ථාවන් හිමිවිය යුතු ය යන අවධාරණය සහිත එම අරමුණ දිනාගැනීමේ ක්‍රියාකාරකමක් පිළිබඳව ය. සාම්ප්‍රදායික ව, ස්ත්‍රීයට වෙන් කර තිබූ ගෘහාශ්‍රිත කටයුතුත් පුරුෂයාට වෙන්කර තිබූ පොදු කටයුතුත් පිළිබඳ දැඩි බෙදුම වෙනසකට ලක්වන අයුරින් මෙම ක්ෂේත්‍ර දෙකේ ම කටයුතු ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂය ම සහයෝගයෙන් හා සහජීවනයෙන් ඉටුකිරීමේ අවශ්‍යතාව ස්ත්‍රීවාදයෙන් මතු කරන බවයි.

මෙවන් සංදර්භයක ස්ත්‍රීවාදය ශ්‍රී ලංකාව වැනි රටවලටත් අදාළ වේ. සහයෝගී සාමකාමී සමාජයක් බිහිකිරීමට නම් ස්ත්‍රිය ද මානව සත්ත්වයෙක් ලෙස පිළිගත යුතු වේ. සැමට සමාන සැමට ගරුකරන සමාජයක් ගොඩනැගීමට නම් බටහිරට පමණක් නොව පෙරදිග සමාජවලට ද අවශ්‍ය ම කරුණකි. සංවර්ධනය යනුවෙන් සඳහන් කරන්නේ එය යි.

## ශ්‍රී ලංකාවේ ස්ත්‍රීවාදය සම්බන්ධයෙන් පවතින අභියෝග

ශ්‍රී ලංකාවේ ස්ත්‍රීවාදය සම්බන්ධයෙන් පවතින ප්‍රබල අභියෝගය නම් එය අපරදිග චින්තනයක් ලෙස බැහැර කිරීම යි. එය ශ්‍රී ලංකාවේ සමාජ සංවර්ධනයටත් අදාළ වන ගැටලුවක් වන්නේ මානව සංවර්ධන විමසා බැලීමේ දී ස්ත්‍රිය විතැන් කිරීමයි. ශ්‍රී ලංකාවේ ද සමාජ සංස්ථා ගත් විට ස්ත්‍රීන්ගේ අත්දැකීම්වල පවතින සමාන කමත් ස්ත්‍රිය තවදුරටත් දෙවැන්නියක් ලෙස හඳුනා ගැනීමත් ප්‍රබල ගැටලුවක් වේ. ශ්‍රී ලංකාවේ ස්ත්‍රීවාදය සම්බන්ධයෙන් සාකච්ඡා කරන විට මතුව එන තවත් අභියෝගයක් නම් නාගරික මධ්‍යම පංතිය ආශ්‍රයෙන් ගොඩනැගුණක් වීමයි. විශේෂයෙන් "පවුල් අවුල් වූ, විවාහය අසාර්ථක වූ ස්ත්‍රීන් ග්‍රාමීය ස්ත්‍රීන්ගේ පවුල් විනාශ කිරීමට උත්සාහ දරන බවයි. මෙවැනි මතවාද නැවත වතාවත් ප්‍රතිනිෂ්පාදනය කරන්නේ ද පුරුෂාධිපත්‍ය සමාජය ම නිසා මෙවැනි ප්‍රකාශන සමාජයෙහි ව්‍යාප්ත කිරීමෙන් ද හඳුනාගත හැක්කේ ස්ත්‍රිය පීඩාවට පත් කිරීම බව පැවසිය හැකි ය. ස්ත්‍රීන් කෙරෙහි දක්වන ආකල්පය ද තවදුරටත් හිතකර නොවේ. එය ද ස්ත්‍රීවාදය ව්‍යාප්ත වීමේ දී හඳුනාගත හැකි අභියෝගයකි. ස්ත්‍රීවාදයට විශ්වීය පදනමක් නොමැත යනුවෙන් ලෝකයේ මෙන් ම ශ්‍රී ලංකාවේ ද ස්ත්‍රීවාදී ව්‍යාපාරයන්ට විවිධ විවේචන එල්ල වී ඇත්තේ ම මෙවන් තත්ත්වයක් නිසායි.

"ස්ත්‍රියට හිමි තැන", පිළිබඳ විවාදය සම තැන ද නිසි තැන ද යන මතවාදයන්ගෙන් සමන්විත ව පොදු ජනතාව අතර මෙන් ම අධ්‍යයන ප්‍රජාව අතර ද ස්ත්‍රීවාදී ව්‍යාපාරය සිටින ස්ථානය හඳුනාගත හැකි ය. මෙවැනි මතවාදවලට කාලය මෙන් ම ශ්‍රමය ද නාස්ති කරන ආකාරය ද ඒ තුළ ද ස්ත්‍රිය තවදුරටත් පීඩාවට පත්වන ආකාරය ද හඳුනාගත හැකි ය. මෙම මතවාදය තවදුරටත් ඉදිරියට

ගෙන යාමට අවශ්‍ය නොවන්නක් මෙන් ම ස්ත්‍රියට අවශ්‍ය සමාජ සංස්ථාවන්හි දී සම තැනම ලෙස දැක්විය හැක. එබැවින් ශ්‍රී ලංකාවේ වර්තමානයේ පවතින ස්ත්‍රීවාදී ව්‍යාපාරයට පවතින අභියෝග ලෙස සම තැන හා නිසි තැන වාදය හරහා සිදුකරන බැහැර කිරීමත් ප්‍රබල අභියෝගයක් ලෙස හඳුනාගත හැකි ය.

ශ්‍රී ලංකාවට උරුම සංස්කෘතික රටාව මගින් ද පුරුෂාධිපත්‍යය පිළිබඳ ඇගයුම් තවදුරටත් සමාජය තුළ ස්ථාපිත වෙමින් ද සමාජ සංස්ථාවල සාම්ප්‍රදායික කාන්තා ප්‍රතිරූපය ප්‍රතිනිෂ්පාදනය කිරීම ද තවදුරටත් ස්ත්‍රීවාදය හමුවේ පවතින අභියෝග ලෙස හඳුනාගත හැකි ය. ශ්‍රී ලංකාවේ පවතින සමාජය ද කාන්තාව විෂයෙහි පවතින සාම්ප්‍රදායික පිළිගැනීම්වලින් පෝෂණය වෙමින් වෙනස් වීම් වලට අකමැති සමාජයක් තවදුරටත් අප හමුවේ දිස් වන ආකාරයයි. කාන්තාවගේ අයිතිවාසිකම් හා නිදහස සැබැවින් ම පරිපූර්ණ ද යන්නත් සමාන ඉඩ ප්‍රස්ථාවන් පිළිබඳවත් නැවත වතාවක් සිතීමේ වගකීම ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවය හමුවේ පවතී. එමෙන් ම වර්තමාන කාන්තාවට හිමි තැන සොයා බැලීමට නම් එම අභියෝගය ජය ගැනීමට පුළුල් කතිකාවක් ගොඩනැගීම අවශ්‍ය වේ.

ප්‍රාථමික සමාජානුයෝජන කාරක වශයෙන් හඳුනා ගන්නා පවුල නැමති සමාජ සංස්ථාව තවදුරටත් ස්ත්‍රීපුරුෂ සමාජභාවීය සමාජානුයෝජනයේ නිරත වී සිටියි. ඒ අතර ම දරිද්‍රතාව, රැකියා ස්ථානවල සිදුවන සූරාකෑම, දේශපාලන ක්‍රියාදාමය තුළ පවතින අසමානතාවන් මෙන් ම සූරාකෑම, පවුල තුළ දක්නට ඇති හිංසනය මෙන් ම සමාජ පීඩනයන්ට ද වර්තමාන ග්‍රාමීය මෙන් ම නාගරික කාන්තාවෝ මුහුණ දෙති. මෙවන් තත්ත්වයන් ද ස්ත්‍රීවාදී ව්‍යාපාරයේ ශක්තිමත්භාවය හීනකර ඇත.

සමාජ සංස්ථාවන්හි දෘශ්‍ය මෙන් ම අදෘශ්‍ය ආකාරයෙන් හඳුනාගත හැකි කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ද පීතෘ අධිපතිධාරී භාවිතයන් නිසා කාන්තාව පිළිබඳ ව පවතින ඇගයුම් කාන්තාවන්ගේ පෞද්ගලික සුභසිද්ධිය පහළට දමන බවත් එය කාන්තාවගේ තත්ත්වයට ඍජුව ම බලපාන බවත් හඳුනාගත හැකි අතර එය ද ස්ත්‍රීවාදී ව්‍යාපාරය හමුවේ පවතින අභියෝගයන් ය. කාන්තාවගේ තත්ත්වය කෙරෙහි හිතකර ප්‍රතිපත්ති ක්‍රියාත්මක වුවත් සංවර්ධන ක්‍රියාදාමයෙහි කාන්තාව තවදුරටත් දෙවැනි තැනකි ලා ඇද දමන සමාජ වාතාවරණයක් ඉහතින් සාකච්ඡා කළ ආකාරයට ශ්‍රී ලංකාවෙන් ද හඳුනා ගත හැකි ය. වර්තමාන ශ්‍රී ලාංකේය සංදර්භය ගත්විට ද කාන්තාව දෙස බලන ආකාරය පවතින සමාජ සංස්කෘතික ඇගයුම් නො වෙනස් ව පවතී. එය වඩාත් තහවුරු වන්නේ කාන්තාව පිළිබඳ පවතින සමාජ මතවාදය සාම්ප්‍රදායික කාන්තාවගේ ප්‍රතිරූපයට සමාන කරමින් එය ඒ ආකාරයෙන් ද බලාපොරොත්තු වෙමින් තවදුරටත් සමාජය තුළ ප්‍රතිනිෂ්පාදනය වෙමින් පවතින බවයි. ශ්‍රී ලංකාවේ, සමාජ වෙනස්වීම් පිළිබඳ සාකච්ඡා කරන චින්තකයින් දක්වන්නේ ශ්‍රී ලංකාවේ විකාශනය බටහිරට සාපේක්ෂ ව ක්‍රමික විකාශනයක් සිදු නොවූ බවයි. විශේෂයෙන් ම යටත්විජිතකරණය ශ්‍රී ලංකාවේ සමාජ ව්‍යුහයට ක්‍රමික ව වෙනස් නොවීමට බලපෑ ප්‍රබල සාධක ලෙස හඳුනාගත හැකි අතර එය ස්ත්‍රීය විෂයෙහි ද වලංගු වේ. සමාජ සංස්ථා ගත්විට ද නූතනත්වය හා සම්ප්‍රදාය යන අන්ත දෙකේ ම එල්බගෙන සිටීමත් නූතනත්වය කරා යාමේ දී අප විසින් අත්හළ යුතු දේ පිළිබඳ ව අවධානය නොකිරීම ද කාන්තාව විෂයෙහි තවදුරටත් පවතින බව හඳුනාගත

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 175-197
ISSN 1800-1459

හැකි ය. උදාහරණයක් ලෙස දැක්වුවහොත් කාන්තාව පිළිබඳ ව සමාජයේ පවතින ඇගයුම තවදුරටත් සාම්ප්‍රදායික යි. තම බිරිඳ එසේත් නැත්නම් තම මව ජනාධිපති වුවත් ගෘහස්ථයේ කාර්යභාරය සිදුකළ යුතු යන්න සමාජයේ අපේක්ෂාව යි. මෙහි දී ඇය තම රැකියාව හරහා සමාජයට ලබාදෙන දායකත්වය සුළු පටු නොවන බවත් ය. එය සමාජයේ සියලු ස්ථරවලට තේරුම් ගැනීමට තරම් හැකියාවක් ඇති නොවන්නේ පුරුෂාධිපත්‍ය ඇගයුම්වල පවතින ප්‍රබලත්වය නිසා ය. වෘත්තීය වශයෙන් සාර්ථකත්වයට වඩා කාන්තාවගේ සමාජ භූමිකාව ඉටුකිරීම තවදුරටත් සමාජය අපේක්ෂා කරන අතර පවුල තුළ අන්‍යෝන්‍ය සුහදත්වය මත තම සහකාරීය හෝ සහකරු සමග පවුලේ කාර්යභාරය බෙදාගනිමින් කටයුතු කිරීමට උත්සාහ නොකරයි. කාන්තාව කෙරෙහි දක්වන පුරුෂ මූලික සමාජ දෘෂ්ටිය නොවෙනස් වුවොත් මෙම කාන්තාවගේ අනාගතය මෙන් ම රටේ සංවර්ධනය සඳහා ද හිතකර නොවේ. මෙම අභියෝගය ජය ගැනීම ශ්‍රී ලංකාවේ ද ස්ත්‍රීවාදී ව්‍යාපාරය හමුවේ පවතියි. රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සංවර්ධනයේ දී කාන්තාවගේ වැදගත්කම මෙන් ම කාන්තාවගේ තත්ත්වය වෙනස් කිරීමට උත්සාහ ගත්තත් සමාජ මතවාදය බාධකයක් වී එය තවදුරටත් අභියෝගක් වී ඇත.

ශ්‍රී ලංකාවේ ස්ත්‍රීවාදය ගත්විට ශක්තිමත් දේශපාලන ව්‍යාපාරයක් ලෙස ස්ථාපිත නොවීම ම කාන්තාවගේ දේශපාලනය කෙරෙහි ඍජුව බලපා ඇත. ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ දේශපාලනය ගත්විට ද කාන්තාවට ඉදිරියට ඒමට ඇති අවස්ථා අහුරා ඇත. ලංකාවේ දේශපාලනය පවුල මූලික කරගත් දේශපාලන ක්‍රමයක් ක්‍රියාත්මක වීම, සමානුපාතික නියෝජන ක්‍රමය, මුදල් නොමැති කම, පුරුෂ මූලික සමාජය අභිබවා යාමට නොහැකි වීම, වැනි තීරණාත්මක සාධක කාන්තාව දේශපාලනයෙන් විතැන් කර ඇත. දකුණු ආසියාවේ මෙන් පශ්චාත් නිදහස් ශ්‍රී ලංකාවේ ද දේශපාලන ක්ෂේත්‍රයෙන් ඉදිරියට පැමිණෙන්නෝ බහුතරයක් පවුලෙන් ලැබෙන දේශපාලන උරුමයෙන් බව පැහැදිලි වේ. විශේෂයෙන් ම පියා, ස්වාමියා සහ සහෝදරයාගෙන් දේශපාලන උරුමය ලබා ගැනීම දැක්විය හැකි ය.

වැන්දඹු දේශපාලන සහලක්ෂය පෙරදිග දේශපාලනයට ආවේණික තත්ත්වයක් ලෙස තිරුචන්ද්‍රන් (1998:24) පෙන්වා දෙයි.

එමගින් ගම්‍යමාන වන්නේ දේශපාලන නියෝජනය ලැබීමට තීරණාත්මක සාධකයක් ලෙස දේශපාලනය කළ සැමියා මිය යෑම හරහා වැන්දඹුව දේශපාලන නියෝජනයක් ලබා ගන්නා ආකාරයයි. ඊට අමතරව ඉහතින් සාකච්ඡා කළ බාධා මැඩගෙන ඉදිරියට පැමිණෙන කාන්තාවන් විරල ය. ශ්‍රී ලාංකේය සමාජයේ පවතින වත්මන් තත්ත්වයට අනුව ග්‍රාමීය ප්‍රදේශ නියෝජනය කරමින් ඉදිරියට ඒමට බලාපොරොත්තු වන කාන්තාවන්ට ඉහතින් සාකච්ඡා කළ අභියෝග ජය ගැනීම ගැන සිතා ගැනීමටත් නො හැකි වේ. 1931 සර්වජන ඡන්ද බලය ලබා දීමේ සිට මේ දක්වා දේශපාලන පද්ධතියේ සියලු ම දේශපාලන සංස්ථාවන්හි කාන්තාවගේ නියෝජනය කණගාටුදායක ස්වරූපයක් තවදුරටත් හඳුනා ගත හැකි ය. බංග්ලාදේශය, ඉංදියාව වැනි රටවල මෙන් ම කාන්තාවන්ටත් කෝටා ක්‍රමයක් මගින් දේශපාලනයට ප්‍රවිශ්ට වීමට අවස්ථා උදාකර ඇත. ලංකාවේ දැනට ක්‍රියාත්මක වන කාන්තා සංවිධාන හරහා 30% ක පංගුවක් ඉල්ලා සිටිය ද එය ද තව වෙන තුරු අසාර්ථක වී ඇත. එවැනි ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 175-197
ISSN 1800-1459

වනවා නම් දේශපාලනයට ඒමට කැමැත්තෙන් සිටින එහෙත් ආර්ථික හැකියාව, පවුල් බලය නොමැති කාන්තාවන්ට ඉඩ ප්‍රස්ථා ලැබෙනු ඇත. එසේ නො වන්නේ නම් වර්තමානයේ පවතින මනාප බලු පොරය තුළ දේශපාලනයේ නියුතුවීමට බලාපොරොත්තු වන කාන්තාවන් ස්ත්‍රීත්වය නිසා අපවාද හා පීඩාවන්වලට ලක් කෙරෙනු ඇත. දැනට යෙදී සිටින කාන්තාවන්ට ද මෙම තත්ත්වය ඇත.

කාන්තාව සංවර්ධන කතිකාව තුළ ප්‍රබල ලෙස සාකච්ඡාවට භාජනය වුවත් ඒවායේ පවතින සාර්ථකත්වය පිළිබඳ සෑහීමකට පත් විය නොහැක. කාන්තාව සහ කාන්තාවගේ ප්‍රශ්න අලෙවි කර ජාත්‍යන්තරයෙන් මූල්‍ය හා වෙනත් ප්‍රතිලාභ ලබා ගැනීමට උත්සාහ කිරීම දැක ගත හැකි තත්ත්වයකි. එමගින් ශ්‍රී ලාංකේය කාන්තාවන්ගේ තත්ත්වයන් වැඩි දියුණු වී නොමැති බවත් වර්තමානය වන විට ඡන්ද ලබා ගැනීමේ මුවාවෙන් ඡන්ද කාලවල දී "ඡන්ද පොරොන්දුවක්" ලෙස කාන්තාවගේ ගැටලු දඩමීමා කරගැනීම හඳුනාගත හැකි ය. මෙය රාජ්‍ය මෙන් ම රාජ්‍ය නොවන සංවිධාන ද සිදුකරන ක්‍රියාවලියක් වන අතර මෙම අභියෝග ද ස්ත්‍රීවාදී ව්‍යාපාරය හමුවේ පවතියි.

වැඩවසම් නෂ්ටාවශේෂ හා වික්ටෝරියානු ආකල්පවලින් හෙබි ශ්‍රී ලංකාවේ ජනමාධ්‍යයන්ට අභියෝග කිරීම ස්ත්‍රීවාදී ව්‍යාපාරය අපොහොසත් වී ඇත. පීතෘමූලික ආධිපත්‍යය හා ආකල්ප තවමත් සජීවීලෙස පවතින සමාජ සංස්ථාවක් ලෙස ජනමාධ්‍ය හඳුනාගත හැකි ය. වත්මන් ශ්‍රී ලංකාවේ කාන්තාවගේ තත්ත්වය පහත හෙළන ප්‍රධාන ජනමාධ්‍ය වන රූපවාහිණිය හරහා කාන්තාව වෙළඳ භාණ්ඩයක් ලෙස අර්ථ නිරූපණය කිරීම පිළිකුල් සහගත වේ. ස්ත්‍රී ලිංගිකත්වය වෙළදාම් කිරීම හරහා ස්ත්‍රීත්වයට නිගා කිරීම පිළිබඳ තවමත් රාජ්‍ය හෝ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන කාන්තා සංවිධානයන්හි ද නිද්‍රාශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කෙරේ. ජනමාධ්‍ය හරහා තවදුරටත් දක්නට ලැබෙන්නේ කාන්තාවන් අපකීර්තියට පත්කරවන, කාන්තාවන්ට අදාළ නොවන නිෂ්පාදනවල යොදා ගනිමින් ස්ත්‍රිය තවදුරටත් ගෘහණියක් ලෙස පමණක් පෙන්නුම් කිරීමට උත්සාහ ගැනීමයි. මෙහිදී කාන්තාවගේ බහුවිධ කාර්යයන් නොසලකා හරින අතර සාම්ප්‍රදායික ස්ත්‍රී ප්‍රතිරූපය ම ගොඩනැගීමට උත්සාහ ගන්නා ආකාරය යි. වෙළඳපොළ ආර්ථිකය හා ගෝලීයකරණ ක්‍රියාදාමය තුළ ශ්‍රී ලංකාවේ පමණක් නොව ලෝකයේ ද ස්ත්‍රිය අලෙවි වීම මනුෂ්‍යත්වයට ද නිගා දේ.

ශ්‍රී ලංකාවේ දැනට පවතින ස්ත්‍රීවාදී සංවිධානවලට ප්‍රබල හඬක් නොමැති කම ද ශ්‍රී ලංකාවේ ස්ත්‍රීවාදී ව්‍යාපාරය ප්‍රබල අභියෝගයක් වී ඇත. විශේෂයෙන් අගනගරය කේන්ද්‍ර කරගෙන ක්‍රියාත්මක වන මෙම සංවිධාන හරහා අගනගරයේ උගත් මධ්‍යම පාංතික කාන්තාවන් අතර ව්‍යප්ත වීම ද බාධාවක් ලෙස හඳුනාගත හැකි ය. මෙම සංවිධාන ග්‍රාමීය ස්ත්‍රිය මූලික නොකිරීමත් ස්ත්‍රීවාදී ව්‍යාපාරයේ පවතින අභියෝග ලෙස හඳුනාගත හැකි ය. ස්ත්‍රීපුරුෂ සමාජභාවීය සංවේදී වැඩසටහන් තවදුරටත් ග්‍රාමීය මෙන් ම නූගත් කාන්තාවන් අතර ප්‍රචලිත කිරීමත් කාන්තාවන්ට ප්‍රජනන සෞඛ්‍ය හා ලිංගිකමය කේවල් කිරීමේ බලය නොමැතිකම නිසා සිදුවන ලිංගික ප්‍රචණ්ඩත්වයත් ආමන්ත්‍රණය කිරීම ස්ත්‍රීවාදී ව්‍යාපාරය හමුවේ පවතින ගැටලු වේ.

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013. සත්වැනි කලාපය. පිටු 175-197
ISSN 1800-1459

ශ්‍රී ලංකාවේ කාන්තාවන්ට එරෙහි ව සිදුවන ප්‍රචණ්ඩත්වය ගත් විට ද පවුල තුළ දී රැකියා ස්ථානයේ දී පොදු ප්‍රවාහනයේ දී කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට නොයෙකුත් වර්ගයේ වාචික හා ශාරීරික හිසංසාවන්ට මුහුණ දීමට සිදු වේ. මෙවන් තත්ත්වයක් තුළ දී ද පිරිමින්ගේ බේබදුකම නිසා සිදුවන පීඩනය මෙන් ම යුද්ධය නිසා ද ස්ත්‍රීහු පීඩාවට ගොදුරු වෙති. ශ්‍රී ලංකාවේ බහුතර කාන්තාවන් පිරිසක් ජීවත්වන්නේ තවමත් ග්‍රාමීය ප්‍රදේශවල බැවින් රැකියා වියුක්තික කාන්තාවන් බහුල වී ඇත. එයට හේතුව වශයෙන් හඳුනාගත හැක්කේ ග්‍රාමීය ප්‍රදේශවල කෘෂිකර්මාන්තය ආශ්‍රිත අවිධිමත් රැකියාවල නිරත වූ කාන්තාවන්ට නවීන යන්ත්‍රසූත්‍ර හඳුන්වා දීම මගින් ඔවුන්ගේ ශ්‍රමය අලෙවි කර ගැනීමට නොහැකි වී ආර්ථික අසරණතාව ද හේතුකොටගෙන දරිද්‍රතාවට ඍජුව ම මුහුණ දීමයි. කාන්තාවන්ගෙන් බහුතරයක් මැදපෙරදිග යෑම මෙන් ම ඇඟලුම් කර්මාන්ත ආශ්‍රිත රැකියාවන්වල නිරත වීමෙන් ආර්ථික ස්වාධීනත්වයක් ලැබුව ද කාන්තාවක් වීම නිසා ම ඔවුන්ට සිදුවන තාඩන පීඩන මෙන් ම වෙනත් ගැටලු අතිමහත් ය. මෙවන් ගැටලුවලට විසඳුම් සෙවීම ස්ත්‍රීවාදී ව්‍යාපාරය හමුවේ පවතින අභියෝගයන් වේ.

ශ්‍රී ලංකාවේ නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය හරහා සියලු කාන්තාවන්ට සමාජ ඉණිමගෙහි ඉහළට යාමට මං පෙත් විවර වුව ද තාමත් ස්ත්‍රීන්ගේ නූගත්කම අහෝසි නොවූ ග්‍රාමීය ප්‍රදේශ හඳුනාගත හැකි ය. ගම්බද අඩු ආදායම්ලාභී පවුල්වල කාන්තාවන්, වතුකරයේ හා නාගරික දූගී නිවහන් ප්‍රදේශ තුළ ජීවත් වන කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටමකූ සාධනීය වූවක් නොවේ. අධ්‍යාපනය ගත් විට ද්විතීයික හා තෘතීයික අධ්‍යාපනයේ ඉහළ යාමක් හඳුනාගත හැකි වුවත් උසස් අධ්‍යාපනය මෙන් ම පශ්චාත් අධ්‍යාපනය තවදුරටත් වර්ධනය වීමට පවුලෙන් මෙන් ම සමාජයෙන් ද අවස්ථා ලබා දීම කාන්තාවගේ තත්ත්වය උසස් කරන මෙන් ම රැකියා අවස්ථා උදාවෙන ප්‍රබල සාධකයක් වේ. අනෙක් අතට කාන්තාවන් අධ්‍යාපනය හා රැකියා අවස්ථාවන් නිසා ද කාන්තා ජනගහණය වැඩිවීම නිසා ද විවාහය ප්‍රමාද වීම, කාන්තාවන්ගේ අවිවාහකත්වය ඉහළ යෑම සමාජ සංසිද්ධියක් ලෙස ද හඳුනා ගත හැකි ය. මෙවන් කරුණු කෙරෙහි ද අවධානය යොමුකරමින් ශක්තිමත් ස්ත්‍රීවාදී ව්‍යාපාරයක් අත්‍යවශ්‍ය වේ.

## නිගමනය

> "ස්ත්‍රීවාදය අපරදිග චින්තනයක් ද යන මතවාදය සමග ශ්‍රී ලංකාවේ ස්ත්‍රීවාදී ව්‍යාපාරය බැහැර කළත් එය භූගෝලීය සීමාවට ලඝුකොට නොහැකි බව ශ්‍රී ලංකාවේ ස්ත්‍රීන්ගේ අත්දැකීම් කෙරෙහි අවධානය යොමු කරන විට පෙනේ. "ස්ත්‍රියගේ කායික මෙන් ම මානසික ආරක්ෂාව ද ප්‍රජනන හා ලිංගික ස්වයං නිර්ණනය මෙන් ම සියලු ක්ෂේත්‍රයන්හි දී ස්ත්‍රීයගේ සමානතාව ය යන මේවා, ස්ත්‍රීවාදයේ හරය වේ" (තිරුචන්ද්‍රන්, 2007:17).

නමුත් මෙම ස්ත්‍රීවාදී න්‍යායාත්මක ධාරාවේ ප්‍රකාශනය විවිධ වී ඇත. විටෙක එය රැඩිකල් වන අතර තව විටක මධ්‍යස්ථ ස්වරූපයක් ද කෝපයෙන් හා පශ්චාත් නූතන්වාදී ස්ත්‍රීවාදීන් මෙන් විශ්ලේෂණාත්මක ස්වරූපයෙනි. පවතින

ISSN 1800-1459

සමාජ සංස්කෘතික වටාපිටාවත් සමග විවිධ ස්වරූපයෙන් ස්ත්‍රීවාදය ප්‍රකාශයට පත් වුවත් අත්දැකීම්වල ස්වරූපයේ වෙනසක් නොමැත.

> "සමාජ-ආර්ථික හා දේශපාලන පද්ධතීන් තුළ වන තම විශේෂ නීති, සම්මතයන් හා සම්ප්‍රදායයන් සහිත ව පවත්නා විවිධාකාර ව්‍යුහයන් හා සාරධර්ම පද්ධතීන් කෙරෙහි දක්වන ප්‍රතික්‍රියා වශයෙන්, ස්ත්‍රීවාදයේ දෘෂ්ටිය, අපරදිග වූත් පෙරදිගවූත් සියලු රටවල් හරහා දිවේ" (තිරුචන්ද්‍රන්, 2007:17).

මෙම පර්යේෂණ ලිපිය ආරම්භයේ සිට ම තර්ක කරන ලද්දේ ස්ත්‍රීවාදය වෙනත් න්‍යාය ධාරාවන් මෙන් ම පැමිණියත් අපරදිගින් පැමිණියත් පෙරදිග ද මූලයන් මෙන් ම ස්ත්‍රියගේ විවිධ ගැටලු ඒ ඒ සංදර්භයට අනුව සමාන බවයි.

ඒ අතර ම නීති ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම (ගෘහස්ථ හිංසනය, ස්ත්‍රී දූෂණ පිළිබඳ නීති) කාන්තාවන්ගේ ආර්ථික හා සමාජ තත්ත්වය වැඩි දියුණු කිරීමට උත්සාහ ගැනීම රාජ්‍ය මෙන් ම රාජ්‍ය නොවන සංවිධාන උත්සාහ ගැනීම, ප්‍රශංසනීය උත්සාහයක් ලෙස අගය කළ හැක. නමුත් එය ප්‍රායෝගික තලයේ ක්‍රියාත්මක වන්නේ ද යන්න ප්‍රශ්නකාරී වේ. ශ්‍රී ලාංකේය කාන්තාවට ඡන්ද බලය ලැබීම, පෙර පාසැලේ සිට විශ්වවිද්‍යාලය දක්වා අධ්‍යාපන අවස්ථා ලැබීම පාර්ලිමේන්තු නියෝජනය හා ආර්ථික ක්ෂේත්‍රයේ ප්‍රගතිය යනාදිය මගින් සමස්ත කාන්තා ප්‍රතිශතයට සාධාරණයක් ඉෂ්ඨ වී තිබේ ද? එමෙන් ම සමාන අවස්ථා ලබා දී තිබේද? කාන්තාවට අයිතිවාසිකම් හා නිදහස සුරක්ෂිත ද? යන්න සලකා බැලීමේ දී සෑහීමකට පත් විය නො හැක.

පසුගිය අවුරුදු තිහක් තිස්සේ ශ්‍රී ලංකාවේ සියලු ම පුරවැසියන්ට පීඩා ගෙන දුන් යුද්ධය නිසා ඍජු ලෙසත් වක්‍ර ලෙසත් කාන්තාව පීඩාවට පත්විය. අතුරුදහන්වීම, හිංසා පීඩාවලට ලක් කිරීම, වධදීම, ස්ත්‍රී දූෂණය, ලිංගික ව්‍යාභිචාරය, පහරදීම් සහ මියයෑම ආදී නොයෙක් ස්වරූපයෙන් ප්‍රචණ්ඩත්වයන්ගේ ආදීනවවලට කාන්තාවට මුහුණ දීමට සිදුවීමත් එයට ස්ත්‍රීවාදී ව්‍යාපාරය තුළ ප්‍රබල හඩක් ඉස්මතු නොවීමත් හඳුනාගත හැකි ය.

ස්ත්‍රීවාදී ව්‍යාපාරයේ අනාගතය දෙස බලන විට පෙනී යන්නේ පාරම්පරික කාර්යභාරයන්ට වඩා වෙනස් කාර්යයන්වල නිරත වුව ද කාන්තාව තවමත් දෙවැන්නියක් මිස සම තත්ත්වයෙහි ලා හඳුනා නොගන්නා බවයි. කාන්තාවක් වීම නිසා නිර්මාණය වී ඇති සමාජ මතවාදය තවදුරටත් සමාජය තුළ ක්‍රියාත්මක වන තාක් කාන්තාව මනුෂ්‍යයෙක් ලෙස හඳුනා නොගන්නා අතර ඇයට හිමි සමාජ තත්ත්වය ද ගරුත්වය ද නොලැබේ. පවුල් සංස්ථාව ගත් විට ද පෙනී යන්නේ සාමකාමී සහයෝගී ඒකකයක් නොවන නිසා කාන්තාව පීඩාවට පත්වන බවයි. දේශපාලනයෙහි මෙන් ම ආර්ථිකය තුළ ද කාන්තාවගේ තත්ත්වය සතුටුදායක නියෝජනයක් සිදු නොවන බවයි. ජනමාධ්‍ය හරහා ද නිරන්තරයෙන් ප්‍රතිනිෂ්පාදනය වන සාම්ප්‍රදායක කාන්තා ප්‍රතිරූපය කාන්තාවගේ සමාජ තත්ත්වය තවදුරටත් පහළ දමන බවයි. රැකියා අංශයෙහි ද කාන්තාවගේ සාර්ථකත්වය පවතින්නේ සීමා සහිත ක්ෂේත්‍රයන් වටා වන අතර ඇයට පැවරී ඇති සමාජ භූමිකාව පවුලට මෙන් ම සමාජයට ද ඉටුකළ යුතු නිසා විවධ ක්ෂේත්‍රයන්ට

යොමුවීමට අවස්ථාවන් උදා නොවේ. සමාජ ආර්ථික දේශපාලන සංදර්භය ගත් විට පුරුෂයාගේ බලය අධිපතිභාවය වර්ධනය කිරීම උදෙසා ක්‍රියාත්මක වෙමින් පවතින සංවර්ධන ක්‍රියාදාමයක් බව හඳුනාගත හැකි ය. කාන්තාවට සැබෑ නිදහසක් ද පුරුෂයාට සමාන තත්ත්වයක් ද කාන්තාවක් වීම නිසා ගොඩනැගී ඇති සමාජ මතවාදය ද පවතින සමාජ සංස්කෘතික සංදර්භය තුළ ස්ත්‍රීවාදී ව්‍යාපාරයට එරෙහි ව ඉදිරියට යාමට අවස්ථාව නොලැබී ඇති බවයි. මෙම ලිපියෙන් අවසාන වශයෙන් දැක්විය හැක්කේ ශ්‍රී ලංකාවේ ස්ත්‍රීවාදී ව්‍යාපාරය අභියෝග රැසක් මැද මන්දගාමී ස්වරූපයක් ගන්නා බවයි.

## පරිශීලිත මූලාශ්‍රය

ගුණරත්න, දීප්ති, මාර්තු-අප්‍රේල් කලාපය (2008) *ස්ත්‍රී ආත්ම මූලික භාවය*, පෙරදිග සුළං, රත්මලාන

ජයසේන, චන්දිමා (2010) "ථේරී ගාථා තුළින් නිරූපණය වන ස්ත්‍රී විමුක්තිය: සමාජ විද්‍යාත්මක විශ්ලේෂණයක් ", ධම්මික, පැල්මඩුල්ල හා තවත් අය(සංස්:) *අභිවරණ, වෙහැල්ලේ ධම්මපාල අභිනන්දන ශාස්ත්‍රීය සංහිතාව*, නුගේගොඩ, සයිබර්ගේට් සර්විසස් පෞද්ගලික සමාගම

තිරුචන්ද්‍රන්, සෙල්වි (1998) *ස්ත්‍රී පුරුෂ සමාජභාවීය බලගමෘතා සහ පශ්චාත් විජිතමය ශ්‍රී ලංකාවේ ස්ත්‍රී සමාජ නියෝජනය*, කොළඹ, කාන්තා අධ්‍යාපන හා පර්යේෂණ කේන්ද්‍රය

_______________ (2007) *ස්ත්‍රීවාදී දර්ශන කෝණයෙන් සමාජ න්‍යායන් විග්‍රහ කිරීම*, කොළඹ, කාන්තා අධ්‍යයන සහ පර්යේෂණ කේන්ද්‍රය

භාසින්, කමලා (2006) *ගැහැණු ළමයා යනු කවරෙක් ද?පිරිමි ළමයා යනු කවරෙක් ද?*, කොළඹ,සමාජ විද්‍යාඥයින්ගේ සංගමය

ලියනගේ, කේ, සහ වළාකුළුගේ, එස් (2006) *ස්ත්‍රී පුරුෂ සමාජ භාවය සහ ස්ත්‍රීවාදය*, කොළඹ, ෆේඩ්රික් ඊබට් පදනම

Cuff, E.C., Sharrock, W.W., Francis, D.W (1990) *Perspectives in Sociology*, London and New York, Routledge.

De Beauvoir Simone (1988) *The Second Sex,* (First published in French in 1942 in English in 1953), Harmondsworth, Penguin

Dominelli, Lena (1991), *Women across Continents: Feminist Comparative Social Policy*, London, Harvester / Wheatshea

_______________ (1997), *Sociology for Social Work,* Macmillan

Durkheim, Emile (1984), *The Division of Labour in Society*, Macmillan

Eichler, M (1980) *The Double standard: A Feminist critique of Feminist Social Science,* London,Croom Helm

Eisenstein, Z (1979) *Capitalist Patriarchy and the Case for Socialist Feminism*, New York , Monthly Review Press

*Encyclopedia of Women in American Politics*, (1999) (ed.) Jeffrey D.Schultz and Laura Van Assendelft, Arizona, Oryx Press

Mead Margaret, (1935) *Sex and Temperament in Three Primitive Societies*, New York, Dell Publishing Company

Oakley, A (1974) *The Sociology of Housework,* London, Martin Robertson.

Smith, D.E (1979) *A Peculiar Eclipse: Women's Exclusion from Men's Culture,* in Women's Studies International Quarterly, Milton Keynes, Open University Press

Smith, D.E (1987) *The Everyday World as Problematic: A Feminist Sociology,* Milton Keynes, Open University Press

Stanley, L and Wise, S (1983) *Breaking out: Feminist Consciousness and Feminist Research,* London, Routledge & Kegan Paul

Tong, R (1989) *Feminist Thought: A Compreheiive Introduction*, San Francisco, Westview press

Wollestoncraft, Mary, (1975) *A Vindication of the Rights of Women,* (First published in 1972) Harmondsworth, Penguin